# 5 වැනි පරිච්ඡේදය







# විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති


## 5.1 සමස්ත නිරීක්ෂණ

ලෝක ආර්ථිකය අඛණ්ඩව වර්ධනය වන පසුබිමක් තුළ ශ්‍රී ලංකාවේ විදේශීය අංශය අභියෝග රැසකට සාර්ථකව මුහුණදෙමින් 2006 වසරේදී ද නොකඩවා ප්‍රසාරණය විය. මෙම වසරේදී නොකඩවා දෙවන වසරටත් ගෙවුම් තුලනයේ අතිරික්තයක් වාර්තා කළේය. විදේශීය සෘජු ආයෝජන ද 1997 දී සනිටුහන් කරන ලද වාර්තා ගත මට්ටම ද අභිබවමින් 2006 වසරේදී ඉතා ඉහළ අගයක් වාර්තා කළේය. ප්‍රධාන අපනයන ගමනාන්තයන්ගේ ඉහළ ආර්ථික වර්ධනයත්, වරණීය වෙළෙඳ ගිවිසුම් යටතේ තෝරාගත් වෙළෙඳපොළවලට ප්‍රවේශවීමත් මෙන්ම සුවිශේෂ ලාභදායි ලෙස සැළකෙන වෙළෙඳපොළවලට ප්‍රවිෂ්ටවීමට අපනයනකරුවන් විසින් දරනු ලැබූ නිරන්තර ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ අපනයන අඛණ්ඩව වර්ධනය විය.


තියුණු ජාත්‍යන්තර තරඟකාරිත්වය මධ්‍යයේ වුවද, 2006 වසරේදී, රෙදිපිළි සහ ඇඟළුම් අපනයනයන් එ.ජ. ඩොලර් බිලියන 3 ක මට්ටම ඉක්මවූ අතර, වෙළෙඳ වාරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ, යුරෝපීය සංගමයේ වෙළෙඳපොළවලට පිවිසීමේ හැකියාව වැඩි වීම සහ ඇමෙරිකා එක්සත් ජනපදයෙන් තවදුරටත් පැවැති ඉල්ලුම මේ සඳහා හේතු විය. කලාපීය රටවල ඇති වූ වේගවත් වර්ධනය, විශේෂයෙන්ම, බහාළුම් ප්‍රතිනැව්ගත කිරීම් සහ සංචාරක කටයුතු වැනි සේවා අංශයේ අපනයනවල ඉහළ යාමට හේතු විය. වසරේ අග භාගයේදී සංචාරකයන්ගේ පැමිණීම පසුබෑමකට ලක් වුවද, සංචාරක ඉපැයීම්වල වටිනාකම සැලකූ විට, සංචාරක ව්‍යාපාරයේ සමස්ත ක්‍රියාකාරීත්වය පසුගිය වසරට වඩා වැඩි ප්‍රගතියක් පෙන්නුම් කළේය. අඛණ්ඩව දෙවන වසරටත් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැළකිය යුතු අයුරින් ඉහළ ගියේය. මේ අතර, ආයෝජන භාණ්ඩ ආනයන ඉහළයාම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල ඉහළයාම හේතුවෙන්, ආනයන වියදම් වැඩි වේගයකින් වර්ධනය විය. වසර තුළ දී, අසාමාන්‍ය ලෙස ඛනිජ තෙල් මිල ඉහළයාම වෙළෙඳ අනුපාතිකය සියයට 3.5 කින් පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවිය. ඉහත සංවර්ධනයන් පිළිබිඹු කරමින්, විදේශ සංචිත ඉහළ ගිය අතර, එයින් විදේශ අංශය, බාහිර කම්පනයන්ට මුහුණදීමේ ඇති හැකියාව ශක්තිමත් විය. විදේශ විනිමය වෙළෙඳපොළ මත ඇතිවන පීඩනය අඩු කරමින්, ශ්‍රී ලංකාව සහ ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කාර රටවල් අතර උද්ධමනයේ පවතින වෙනසට සමගාමීව රුපියල සියයට 5.2 කින් පමණ අවප්‍රමාණය විය. ඉහළ යන ඛනිජ තෙල් මිල හේතුවෙන් ගෙවුම් තුලනය මත ඇතිවන බලපෑම අවම කිරීම, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ උච්ඡාවචනයන් අවම කිරීම සහ ඉහළ යන ඛනිජ තෙල් මිලෙන්, පාරිභෝගිකයා ආරක්ෂා කිරීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉදිරි රැකුම් ගිවිසුම්වලට (Hedging Arrangements) එළඹීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දිරි ගැන්වීමට, ශ්‍රී ලංකා මහ බැංකුව මූලික වී කටයුතු කළේය.

**5.1 රූප සටහන** | **විදේශීය වෙළෙඳාම**


**ආනයන සහ අපනයන වටිනාකම**




**ආනයන සහ අපනයන පරිමා දර්ශකය (1997 = 100)**





**ආනයන සහ අපනයන ඒකක මිල දර්ශක සහ වෙළෙඳ අනුපාතය (1997 = 100)**




## 5.2 විදේශීය අංශයේ ප්‍රතිපත්තීන් සහ ආයතනික පහසුකම්

පූර්ණ විවෘතභාවයකින් යුතු ජංගම ගිණුමෙන් ද, පාර්ශ්විකව විවෘතව පැවති ප්‍රාග්ධන ගිණුමෙන් සහ නිදහසේ පාවෙන විදේශ විනිමය අනුපාතයෙන් ද ශක්තිමත් වෙමින්, 2006 වසරේදී විදේශීය වෙළෙඳාම සහ මූල්‍ය කටයුතු, අඛණ්ඩව තවදුරටත් නිදහස් සහ ලිහිල් ආර්ථික පරිසරයක් තුළ ක්‍රියාත්මක විය. අභ්‍යන්තර හා බාහිර කම්පනයන් මධ්‍යයේ වුවද, රටේ පැවති නිදහස් ආර්ථික ප්‍රතිපත්තීන් මෙන්ම හිතකර ආයෝජන පරිසරය සහ ගෙවීම් හා පියවීම් ක්ෂේත්‍රවල ඇති වූ දියුණුව හේතුවෙන්, පසුගිය වසරවල දී ඉහළ ආර්ථික වර්ධනයක්

**5.2 රූප සටහන** | **ගෙවුම් තුලනය**



**5.1 සංඛ්‍යා සටහන**

## ගෙවුම් තුලන විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම (අ)

| ශීර්ෂය | එ.ජ.ඩොලර් දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2002 | 2003 | 2004 | 2005 | 2006 (ආ) | 2002 | 2003 | 2004 | 2005 | 2006 (ආ) |
| වෙළෙඳ ශේෂය | -1,406 | -1,539 | -2,243 | -2,516 | -3,370 | -134,706 | -148,324 | -227,171 | -253,082 | -350,037 |
| අපනයන | 4,699 | 5,133 | 5,757 | 6,347 | 6,883 | 449,855 | 495,426 | 583,967 | 638,276 | 716,579 |
| ආනයන | 6,106 | 6,672 | 8,000 | 8,863 | 10,253 | 584,561 | 643,750 | 811,138 | 891,359 | 1,066,615 |
| සේවා (ශුද්ධ) | 295 | 399 | 419 | 338 | 257 | 28,224 | 38,443 | 42,735 | 34,043 | 26,660 |
| ලැබීම් | 1,268 | 1,411 | 1,527 | 1,540 | 1,625 | 121,340 | 136,123 | 154,746 | 154,877 | 168,802 |
| ගෙවීම් | 974 | 1,012 | 1,108 | 1,202 | 1,368 | 93,115 | 97,680 | 112,011 | 120,833 | 142,142 |
| ආදායම් (ශුද්ධ) | -252 | -172 | -204 | -299 | -388 | -24,167 | -16,535 | -20,688 | -30,049 | -40,353 |
| ලැබීම් | 75 | 170 | 157 | 35 | 311 | 7,201 | 16,385 | 15,813 | 3,629 | 32,457 |
| ගෙවීම් | 328 | 341 | 360 | 335 | 700 | 31,368 | 32,920 | 36,501 | 33,678 | 72,810 |
| **භාණ්ඩ සේවා හා ආදායම (ශුද්ධ)** | **-1,364** | **-1,312** | **-2,028** | **-2,478** | **-3,502** | **-130,648** | **-126,416** | **-205,124** | **-249,088** | **-363,730** |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 1,097 | 1,205 | 1,350 | 1,736 | 2,068 | 104,980 | 116,350 | 136,672 | 174,542 | 215,102 |
| ලැබීම් | 1,287 | 1,414 | 1,564 | 1,968 | 2,326 | 123,183 | 136,475 | 158,291 | 197,968 | 241,919 |
| ගෙවීම් | 190 | 209 | 214 | 233 | 257 | 18,202 | 20,125 | 21,619 | 23,426 | 26,817 |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 31 | 36 | 30 | 93 | 101 | 2,982 | 3,441 | 3,038 | 9,300 | 10,524 |
| **ජංගම ගිණුම** | **-236** | **-71** | **-648** | **-650** | **-1,334** | **-22,686** | **-6,625** | **-65,414** | **-65,246** | **-138,104** |
| ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම | 444 | 722 | 631 | 1,224 | 1,807 | 40,639 | 69,723 | 60,539 | 123,866 | 190,751 |
| ප්‍රාග්ධන ගිණුම | 65 | 74 | 64 | 250 | 291 | 6,219 | 7,146 | 4,974 | 25,108 | 30,289 |
| ප්‍රාග්ධන සංක්‍රාම (ශුද්ධ) | 65 | 74 | 64 | 250 | 291 | 6,219 | 7,146 | 4,974 | 25,108 | 30,289 |
| ලැබීම් | 71 | 81 | 71 | 257 | 299 | 6,782 | 7,768 | 5,643 | 25,863 | 31,169 |
| ගෙවීම් | 6 | 6 | 7 | 7 | 8 | 563 | 622 | 669 | 755 | 879 |
| **මූල්‍ය ගිණුම** | **379** | **648** | **567** | **974** | **1,517** | **34,420** | **62,577** | **55,565** | **98,757** | **160,462** |
| දිගු කාලීන | 326 | 722 | 680 | 798 | 906 | 28,911 | 69,721 | 69,805 | 80,391 | 95,074 |
| සෘජු ආයෝජන | 185 | 201 | 227 | 234 | 451 | 17,716 | 19,450 | 22,826 | 23,505 | 46,971 |
| විදේශීය සෘජු ආයෝජන (ශුද්ධ) | 181 | 171 | 217 | 234 | 451 | 17,281 | 16,557 | 21,948 | 23,505 | 46,971 |
| පෞද්ගලීකරණ ලැබීම් | 5 | 30 | 10 | - | - | 435 | 2,893 | 878 | - | - |
| පෞද්ගලික දිගුකාලීන (ශුද්ධ) | -21 | -33 | 14 | 11 | -35 | -2,039 | -3,201 | 2,270 | 1,054 | -3,591 |
| ලැබීම් | 115 | 101 | 169 | 197 | 139 | 11,007 | 9,738 | 17,503 | 19,739 | 14,465 |
| ගෙවීම් | 136 | 134 | 155 | 186 | 174 | 13,046 | 12,939 | 15,233 | 18,685 | 18,056 |
| රජයේ දිගුකාලීන (ශුද්ධ) | 162 | 554 | 439 | 553 | 491 | 13,233 | 53,472 | 44,709 | 55,832 | 51,694 |
| ලැබීම් | 542 | 913 | 771 | 747 | 932 | 51,843 | 88,106 | 78,299 | 75,309 | 97,690 |
| ගෙවීම් | 380 | 359 | 331 | 194 | 441 | 38,610 | 34,634 | 33,590 | 19,477 | 45,996 |
| කෙටිකාලීන | 53 | -75 | -112 | 176 | 610 | 5,509 | -7,145 | -14,240 | 18,366 | 65,387 |
| විවිධ ආයෝජන (ශුද්ධ) | 25 | 2 | 11 | 60 | 51 | 2,443 | 209 | 1,109 | 6,103 | 5,377 |
| පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ) | 68 | 19 | 28 | 16 | -30 | 6,548 | 1,877 | 2,514 | 1,640 | -3,066 |
| වාණිජ බැංකු වත්කම් (ශුද්ධ) | 104 | -94 | -354 | -223 | 297 | 6,893 | -9,090 | -45,367 | -19,669 | 23,789 |
| වාණිජ බැංකු වගකීම් (ශුද්ධ) | -145 | -2 | 202 | 323 | 293 | -10,375 | -141 | 27,504 | 30,292 | 39,287 |
| රජයේ කෙටිකාලීන (ශුද්ධ) | - | - | - | - | - | - | - | - | - | - |
| රුපියල් අගය පිළිබඳ ගැලපීම | 93 | - | - | - | - | 8,900 | - | - | - | - |
| වැරදීම් හා අත්හැරීම් | 38 | -148 | -189 | -72 | -270 | 9,197 | -14,487 | -2,599 | -10,494 | -15,426 |
| **සමස්ත ශේෂය (ඇ)** | **338** | **502** | **-205** | **501** | **204** | **36,051** | **48,610** | **-7,474** | **48,125** | **37,221** |
| මූල්‍ය වෙනස්වීම් (ඇ) | -338 | -502 | 205 | -501 | -204 | -36,051 | -48,610 | 7,474 | -48,125 | -37,221 |
| වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය | | | | | | | | | | |
| ශ්‍රී ලං. රු./ එ.ජ. ඩොලර් | | | | | | 95.66 | 96.52 | 101.19 | 100.50 | 103.96 |
| ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස | | | | | | | | | | |
| වෙළෙඳ ගිණුම | -8.5 | -8.4 | -11.2 | -10.7 | -12.5 | -8.5 | -8.4 | -11.2 | -10.7 | -12.5 |
| ජංගම ගිණුම | -1.4 | -0.4 | -3.2 | -2.8 | -4.9 | -1.4 | 0.4 | -3.2 | -2.8 | -4.9 |
| ප්‍රදානයන් හැර ජංගම ගිණුම | -1.6 | -0.6 | -3.4 | -3.2 | -5.3 | -1.6 | -0.6 | -3.4 | -3.2 | -5.7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම සංඛ්‍යා ගෙවුම් තුලන අත්පොතේ 5 වන සංස්කරණය (1993) ට අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන අයුරින් සකස් කොට ඇත. මීට අමතරව 1994 සිට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකද දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකා ඇත.

(ආ) තාවකාලික

(ඇ) මූල්‍ය අංශයේ සියලුම ගණුදෙණු කාලච්ඡේදය අවසානයේ විනිමය අනුපාතිකයන්ට අනුව පරිවර්තනය කර ඇත.

අත්කර ගැනීමට හැකි විය. දේශීය නිෂ්පාදනයේ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම තුළින් සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳ හා ආයෝජන ගිවිසුම් තුළින් විවෘත වන වෙළෙඳපොළවල් හරහා මතුවන අපනයන විවිධාංගීකරණය අරමුණු කරගෙන විදේශීය වෙළෙඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය.

**රුපියල්වලින් ප්‍රකාශිත රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීමට, විදේශිකයන්හට ඉඩ සලසමින්, 2006 වසර තුළ දී, ප්‍රාග්ධන ගිණුම තවදුරටත් නිදහස් කරන ලදී.** දැනට පවතින සහනදායි මූල්‍යනයන්ට අමතරව, අත්‍යවශ්‍ය ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා, රජයට තවදුරටත් දිගුකාලීන විදේශීය මූල්‍ය ලබා ගැනීමට සිදුවේ. එමනිසා, විදේශීය ණය දරා ගැනීමේ හැකියාව පිළිබඳ මනා අවබෝධයකින් යුක්තව, අවශ්‍ය විදේශීය මූල්‍ය සපයා ගැනීම සඳහා, ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළේ ශ්‍රී ලංකාවට නියෝජනය කිරීමේ අවශ්‍යතාවය මතු වේ. මේ සඳහා ගත් පියවරක් ලෙස, 2006 නොවැම්බර් මස 01 වන දින සිට රජය විසින් රුපියල් වලින් ප්‍රකාශිත රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනයට, විදේශිකයින්ට ද අවස්ථාව දෙනු ලැබීය. විදේශීය ආයෝජකයන්හට ආයෝජනය කළ හැකි සීමාව ඕනෑම අවස්ථාවක භාණ්ඩාගාර බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති වටිනාකමෙන් සියයට 5 ක උපරිමයකට යටත් වේ. මේ අනුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කළ විදේශීය රටවල අරමුදල්, සහයෝගී අරමුදල් (Mutual Funds) සහ ප්‍රාදේශීය අරමුදල් (Regional Funds) මෙන්ම ශ්‍රී ලංකාවෙන් බාහිරව ස්ථාපිත සංස්ථාවලට සහ විදේශීය පුරවැසියන්ටද මෙම රුපියල්වලින් ප්‍රකාශිත භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීමට අවසරය ලබා දී ඇත. අරමුදල් ක්ෂණිකව රටින් පිටතට ගලායෑමෙන් මතු විය හැකි අවදානම අවම කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එ.ජ. ඩොලර්වලින් සැදුම්ලත් විදේශ අරමුදලක් පිහිටුවීමට කටයුතු කර ඇති අතර, එමගින් මේ හා සම්බන්ධ ඕනෑම විදේශ මුදල් අවශ්‍යතාවයක් සපුරාලීමට හැකියාව ලැබේ.

**විශේෂ සටහන 6**

## ප්‍රාග්ධන ගිණුම තවදුරටත් විවෘත කිරීමේ ආර්ථික බලපෑම් සහ ඒ සඳහා තිබිය යුතු පූර්ව අවශ්‍යතාවයන්

ප්‍රාග්ධනය රට තුලට සහ ඉන් පිටතට නිදහසේ ගමන් නොකරන ආවෘත ප්‍රාග්ධන ගිණුම් ක්‍රමයක සිට ප්‍රාග්ධනය නිදහසේ රට තුළට පැමිණෙන සහ ඉන් පිටව යන ප්‍රාග්ධන ගිණුම් ක්‍රමයක් කරා ගමන් ගැනීම ප්‍රාග්ධන ගිණුම නිදහස් කිරීමේ ක්‍රියාවලියයි. ප්‍රාග්ධන ගිණුම විවෘත කිරීම, පොදුවේ ආර්ථික වර්ධනය දිරිගන්වන අතර, ආයෝජනයන් විවිධාංගීකරණය කිරීම තුළින් අවදානම බෙදාහැරීමට හැකිවීම මෙන්ම කාර්යක්ෂමතාවය වැඩිවීම ද සිදුවේ. ආයෝජනයන් සඳහා දේශීය ඉතුරුම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, බොහෝ නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන් ප්‍රාග්ධන ගණුදෙනුවලට පනවා ඇති සීමාවන් ලිහිල් කිරීම හෝ ඉවත් කිරීම කර ඇති අතර, දේශීය මූල්‍ය වෙළෙඳපොළවල සීමාවන්ද ලිහිල් කර ඇත. කෙසේ වෙතත්, ප්‍රාග්ධන ගිණුම විවෘත කළ පසුව රටවල් කිහිපයකින් මූල්‍ය අර්බුදයන් වාර්තා වුවද, එය මෙම සංකල්පයේ දුර්වලතාවය මත ඇතිවූවක් නොවන අතර, දුර්වල බැංකු සහ මූල්‍ය අංශයන් පැවැතීම හා ඒවා නිවැරදි විචක්ෂණ පාලනයකට සහ සුපරීක්ෂණයකට ලක් නොවීම හේතුවෙන් ඇති වූ අර්බුදයන් වේ.

1978 වසරේදී, ශ්‍රී ලංකාව, තෝරාගත් ප්‍රාග්ධන ලැබීම් සහ ගෙවීම් සඳහා අවසර දෙන ලදී. දැනට පවතින නීතිරීති වලට යටත්ව අපනයන සඳහා කර්මාන්ත නැංවීම, පුළුල් වන ආයෝජන ඉතිරිකිරීමේ පරතරය මූල්‍යනය කිරිම, පිරිවැය අඩු විදේශ අරමුදල් භාවිතයෙන් දේශීය සමාගම්වලට ඔවුන්ගේ නිෂ්පාදන හැකියාව පුළුල් කිරීමට සහයෝගී වීම, විදේශීය සෘජු ආයෝජන සහ කොටස් වෙළෙඳපොළෙහි ආයෝජන අවස්ථාවන් සඳහා අවසර ලබාදී ඇත. මේ අතර, අවදානම් අවම කිරීමේ යාන්ත්‍රනයක් වශයෙන් ශ්‍රී ලාංකිකයන් විසින් රටින් පිටත කරන ආයෝජනයන් සඳහා සහ ඔවුන් ලබාගන්නා විදේශ ණය සඳහා අවසර දී ඇත්තේ, අවස්ථානුකූලව සලකා බලා, ඒ ඒ ව්‍යාපෘතිවල යෝග්‍යතාවය සැළකිල්ලට ගනිමින්ය. මෙම ප්‍රතිපත්ති වෙනස්වීම්වල වාසිය අත්කර ගනිමින්, 1979 දී විදේශීය සෘජු ආයෝජන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 49 දක්වා ඉහළ ගියේය. ඉන්පසුව, මෙම ප්‍රවනතාවය නොකඩවා පැවතුන අතර 2006 වසරේදී එය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 604 ක් කරා ළගා විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය කාලයේදී රටෙහි කර්මාන්ත හා අපනයන පදනම විවිධාංගීකරණයට සහ පුළුල්වීමට ලක්වූ අතර, වර්තමානයේදී රටෙහි මුළු අපනයනයෙන් සියයට 73 ක් සහ කාර්මික අපනයනයන්ගෙන් සියයට 89 ක්ම ආයෝජන මණ්ඩලය විසින් අනුමත කළ ආයතන විසින් කරනු ලබයි. ආසන්න වශයෙන් 400,000 ක පමණ සේවකයින් පිරිසක් ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘතින්හි සෘජුවම සේවානියුක්ත වී සිටින අතර, අදාල අංශයන්හි වක්‍ර රැකියාවන්හි නියුතු සේවකයින් සංඛ්‍යාවද ඉහළ අගයක් ගනී. කොටස් වෙළෙඳපොළ ආයෝජනයන්ද ක්‍රමයෙන් ඉහළ යමින්, 2006 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 354 ක වාර්තාගත මට්ටමකට ළගා විය. මෙවැනි හිතකර පසුබිමක් තුළ වෙළෙඳාම හා සම්බන්ධ අනෙකුත් සේවාවන් වන වරාය ආශ්‍රිත සේවාවන් සහ මූල්‍ය සේවාවන්ද විශාල ලෙස පුළුල් වී ඇත.

හිමිකම් ප්‍රාග්ධනයේ සහ ණයවල පිරිවැය අවමකිරීමෙන් ආයෝජන දිරිගැන්වීම, ඉහළ තරඟකාරිත්වය තුලින් මූල්‍ය පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩිකිරීම සහ ශ්‍රී ලාංකික ආයෝජකයින්ට ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු දේශීයව හා විදේශීයව පුළුල් කිරීමට අවස්ථාව සැලස්වීමත්, ආර්ථික වර්ධනය සඳහා තවදුරටත් පහසුකම් සැලසීමට හැකි මගක් වශයෙන් ප්‍රාග්ධන ගිණුම තවදුරටත් විවෘත කිරීමට යෝජනා ඉදිරිපත් වී ඇත. ශ්‍රී ලංකාව ක්‍රමයෙන් මධ්‍යම ආදායම් ඇති රටක් කරා ලඟා වෙමින් පවතින නිසා බොහෝ දුරට සහනදායී මූල්‍යනය ලබාගැනීමේදී සීමාවන් පැනවීම හේතුවෙන් ප්‍රාග්ධන ගිණුම විවෘත කිරීමේ ක්‍රියාවලිය වේගවත් වී ඇති බව පැහැදිලි වේ. මේ අතර, විදේශීය ආයෝජනයන් සහිත

සමහර දේශීය ව්‍යාපාර, ජාත්‍යන්තර වෙළෙඳපොළවල තරඟකිරීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීමට සමත් වී ඇත. රජයේ මූල්‍ය අවශ්‍යතාවයන් සඳහා විදේශීය නිල මූල්‍යනයන් කාලයත් සමඟම උපරිමයකට ලඟාවී ඇති හෙයින්, රජයටද ජාත්‍යන්තර වශයෙන් ඒකාබද්ධ ණය (Syndicated Loans) හා විදේශීය වාණිජමය ණය ප්‍රමාණවත් අයුරින් ලබාගැනීමේ අවශ්‍යතාවයක් ඇති වී තිබේ. ජාත්‍යන්තර වශයෙන් ණය ලබාගැනීම ලාභදායී වීම හේතුවෙන් වර්තමානයේ සමහර පෞද්ගලික අංශයේ ව්‍යාපාර පවා ජාත්‍යන්තර වශයෙන් ණය ලබාගැනීමට යොමුවී ඇත. සමහර සමාගම් විසින් ඔවුන්ට ජාත්‍යන්තර බැඳුම්කර සහ ණය වශයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළින් ප්‍රාග්ධන අරමුදල් රැස්කිරීමට ඇති හැකියාව පෙන්නුම් කර ඇත. මෙවැනි වර්ධනයක් මගින් පෙන්නුම් කරන්නේ, ජාත්‍යන්තර වෙළෙඳපොල තුලින් සාපේක්ෂව අඩු වියදම් අරමුදල් රැස්කර ගැනීමට, ශක්‍යතාවය ඇති අනෙකුත් සමාගම්වලටද හැකියාව පවතින බවයි.

### ප්‍රාග්ධන ගිණුම විවෘත කිරීමේ මෑත කාලීන ක්‍රියාමාර්ග

2006 වසරේදී, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කළ විදේශීය රටවල අරමුදල්, ප්‍රාදේශීය අරමුදල් හෝ සහයෝගී අරමුදල්, ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත ආයතන සහ විදේශීය පුරවැසියන් හට ඕනෑම අවස්ථාවක රුපියල්වලින් ප්‍රකාශිත භාණ්ඩාගාර බැඳුම්කරවල නොපියවා ඇති වටිනාකමින් සියයට 5 ක උපරිම සීමාවකට යටත්ව ආයෝජනය කිරීමට රජය විසින් අවසරය ලබාදුනි. වසර තුළදී, රජය විසින්, විදේශ මුදල්වලින් ප්‍රකාශිත ජාතිය ගොඩනැංවීමේ බැඳුම්කර, අනේවාසික ශ්‍රී ලාංකිකයන්ට සහ විදේශ විනිමයෙන් ආදායම් ලබන ශ්‍රී ලංකාවේ සිටින හෝ විදේශයක සිටින ශ්‍රී ලාංකික වෘත්තිකයන්ට හඳුන්වා දෙන ලදී. මේ නිසා, නොයෙක් අයුරින් ආර්ථිකයට වැඩි ප්‍රතිලාභ බලාපොරොත්තු විය හැකිය. විදේශීය හා දේශීය ආයෝජකයන්ගේ තරඟකාරී ලංසු තැබීම් තුලින් රජයේ ණය ලබාගැනීමේ පිරිවැය අඩු විය හැක. මීට අමතරව, බාහිර කම්පනයන්හට මුහුණ දීමට රටෙහි ඇති හැකියාව ශක්තිමත් කරමින් බැඳුම්කර නිකුතු මගින් රට තුළට විදේශ මූල්‍ය ලැබෙනු ඇත. කෙසේ වෙතත්, අනාගතයේ සිදුවිය හැකි අවිනිශ්චිත සිදුවීම් හේතුවෙන් ක්ෂණික ප්‍රාග්ධන මුදල් ගලායෑම් ඵලදායී ලෙස වලක්වාලීම සඳහා මෙම මූල්‍ය ලැබීම් විචක්ෂණශීලී ලෙස ආයෝජනය සහ කළමණාකරණය කළ යුතුය. ශ්‍රී ලංකාවේ, ණය ආශ්‍රිත ආයෝජන අවස්ථාවලට, විදේශීය ආයෝජකයන්ගේ ඇති කැමැත්ත වැඩිකරමින් ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ අරමුදල් රැස්කර ගැනීමට ශ්‍රී ලංකාව විසින් දරනු ලබන උත්සාහයයන්ට ඉහත ක්‍රියාමාර්ග මගින් පහසුකම් සලසයි. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර තෝරාගත් ප්‍රාග්ධන ගිණුම් සීමාවන්ගේ වර්තමාන සංසන්දනයක් බී 6.1 සටහන මගින් දක්වා ඇත.

### ප්‍රාග්ධන ගිණුම තවදුරටත් විවෘත කිරීමේ හැකියාව ඇති අංශයන්

විදේශීය සෘජු ආයෝජන නිදහසේ ගලාඒම් සඳහා අවසරය ලබාදී තිබුණද, මුදල් ණයදීම, උකස් සේවාවන්, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1 කට අඩු ප්‍රාග්ධනයක් ඇති සිල්ලර වෙළෙඳාම, වෙරළාසන්න ධීවර කර්මාන්තය වැනි අංශයන්වලට විදේශීය සෘජු ආයෝජනයක් කිරීමට තවමත් අවසරය ලබාදී නොමැත. සමහර අවස්ථාවන්හිදී, සමහර ව්‍යාපෘති සඳහා[1] විදේශීය හිමිකාරත්වයේ සීමාවන් පනවා ඇත. (නිකුත් කළ ප්‍රාග්ධනයෙන් සියයට 40 ක උපරිමයකට පමණක් අවසර දී ඇත.) ආරක්ෂක සහ පාරිසරිකමය හේතූන් මත සමහර අදාල අමාත්‍යාංශවල අවසරය අනිවාර්යයෙන්ම ලබාගත යුතු අංශයන් කිහිපයක්ද ඇත.[2] මෙවැනි සීමාවන් ක්‍රියාත්මක වන අතර, තවදුරටත් ලිහිල් කිරීමට හැකියාව ඇති අංශයන් ලෙසට විදේශීය රටවල සිදුකරන සෘජු ආයෝජන, ශ්‍රී ලංකාවේ සමාගම් විදේශීය කොටස් වෙළෙඳපොළවල ලියාපදිංචි කිරීම, ශ්‍රී ලංකාවේ ස්ථාපිත සමාගම්වලට විදේශීය ණය ලබාගැනීම, දිගු කාලීන අරමුදල් මගින් කරනු ලබන විදේශීය ආයෝජනයන්, ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත සමාගම් කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි කිරීම සහ දේශීය සමාගම් හඳුන්වා දෙන ණය ආශ්‍රිත ආයෝජනවලට අවස්ථා ආයක වීමට අනේවාසිකකයන් හට අවසර දීම යනාදිය හැඳින්විය හැක. මේ සඳහා අදාල අධිකාරීන් විසින් මෙම අංශයන් තවදුරටත් අධීක්ෂණය කළහැකි අතර, සුදුසු ආකාරයෙන් එළඹෙන කාලය තුළදී ප්‍රතිචාර දැක්විය යුතුය.

### ප්‍රාග්ධන ගිණුම තවදුරටත් විවෘතකිරීම සඳහා තිබිය යුතු පූර්ව අවශ්‍යතාවයන්

විශාල ලෙස ප්‍රාග්ධන අරමුදල් ගලාඒම මගින් දේශීය මූල්‍ය පද්ධතියට ඇතිවන බලපෑම, විනිමය අනුපාතිකයේ උච්ජාවචනයන්, තරඟකාරිත්වය සහ සාර්ව ආර්ථික කළමනාකරණය සංකීර්ණ වීම වැනි අවදානම් සලකා බලන අතරතුර මෙවැනි ප්‍රතිපත්තියක් කරා ගමන් කිරීමට පෙර ඒ සඳහා අවශ්‍යවන සමහර මූලික පූර්ව කොන්දේසීන් සුපරීක්ෂාකාරීව සලකා බැලිය යුතුය. දේශීය පොලී අනුපාතිකය සහ ගෝලීය පොලී අනුපාතිකයන්හි සංයෝජනය තුළින් පොලී අනුපාතිකයන් අතර වෙනස පටුවීමද මෙය තුළ ඇතුළත් අතර, මෙමගින් ප්‍රාග්ධන ප්‍රවාහවල සමපේක්ෂණය අවම කළහැකි අතර, දිගුකාලීන ප්‍රාග්ධන ප්‍රවාහයන්ද ධෛර්මත් කෙරේ. මේ සඳහා පහළ සහ ස්ථායී උද්ධමන වේගයක් රටතුළ පවත්වාගැනීම අත්‍යවශ්‍ය වේ. ප්‍රාග්ධන ගිණුම පුළුල් කිරීමට ප්‍රථම අනාගත මූල්‍ය අර්බුදයන් වලක්වා ගැනීමට, ශක්තිමත් හා නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වන නීතිමය රාමුවක් සහ වැඩි දියුණු කළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් තවදුරටත් පවත්වාගත යුතුය. පවතින නීතිමය රාමුවේ ඵලදායකත්වය, රටෙහි පවතින සාර්ව ආර්ථික පරිසරය සහ ව්‍යවස්ථාපිත ආයතන, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල ස්ථායිතාවය සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කිරීම තුළින් එම ක්‍රියාමාර්ග අනුපිළිවෙලින් දක්වා ඇති පැහැදිලි මාර්ගෝපදේශයක් පිළියෙල කිරීමද අත්‍යවශ්‍ය වේ.

---

(1) මෙම ව්‍යාපාරයන් වශයෙන් (i) ජාත්‍යන්තරව තීරණය වී ඇති පංගුවලට යටත්ව ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ නිෂ්පාදනය (ii) තේ, රබර්, පොල්, සහල්, සීනි සහ කුළු බඩු වර්ග වගාකිරීම සහ මූලික සැකසීම (iii) යලි ජනනය නොවන ජාතික සම්පත් කැනීම යන මූලික සැකසීම (iv) දේශීය දැව භාවිතයෙන් දැව පදනම් කරගත් කර්මාන්තයන් (v) ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය, (vi) ජන සංන්නිවේදනය (vii) අධ්‍යාපනය (viii) භාණ්ඩ නැව් ගත කිරීමේ ව්‍යාපාර (ix) සංචාරක නියෝජිත ආයතන සහ (x) නැව් නියෝජිත ආයතන

(2) මෙහි ඇතුලත් අංශයන් නම් (i) ගුවන් ප්‍රවාහනය (ii) වෙරළාසන්න නාවික ගමන් (iii) 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පිවිසුමේ දෙවන ලේඛනය යටතේ ඇති කාර්මික ව්‍යාපාරයන් (ගිනි අවි, පතරොම්, පුපුරණ ද්‍රව්‍ය, හමුදා රථ සහ යුධ උපකරණ, ගුවන් යානා සහ අනෙකුත් යුධ ආම්පන්න නිපදවන කාර්මාන්තයන්; විෂ ද්‍රව්‍ය, මත් ද්‍රව්‍ය, මත්පැන්, අනතුරුදායක බොහෙත් ද්‍රව්‍ය සහ විෂ වර්ග, උපද්‍රව සහිත සහ පිළිකාකාරක ද්‍රව්‍ය නිපදවන කර්මාන්තයන්; සහ මුදල් හා කාසි හෝ ආරක්ෂිත ලියකියවිලි නිෂ්පාදනය කරන කර්මාන්තයන්) (iv) මහා පරිමාණයෙන් යාන්ත්‍රිකව කරනු ලබන මැණික් කැනීම සහ (v) ලොතරැයි ව්‍යාපාරය.

**සටහන බ. 6.1 ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ වර්තමාන ප්‍රාග්ධන ගිණුමේ පවතින සීමාවන්**

| අයිතමය | | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|---|
| 1. විදේශීය සෘජු ආයෝජන | විදේශීය | අවස්ථානුකූලව සලකා බලා අවසර ලබාදේ. | සමාගම් සහ ලියාපදිංචි හවුල් ව්‍යාපාර ආයතන ඔවුන්ගේ ව්‍යාපාරවල ශුද්ධ වටිනාකමින් සියයට 200 ක් දක්වා විදේශ ව්‍යාපාරික කටයුතුවල ආයෝජනය කිරීමට අවසරය ලබාදී ඇත. |
| | දේශීය | අංශ කිහිපයක් හැර අනෙකුත් සියළුම අංශයන් පූර්ණ වශයෙන් විවෘතකර ඇත.(පාද සටහන් 1 හා 2 බලන්න) | ස්වයංක්‍රීයව ක්‍රියාත්මක කළහැකි ආයෝජන මාර්ග යටතේ එක් එක් අංශයන්හි ඉහළම ප්‍රාග්ධන සීමාවන්ට යටත්ව, ආයෝජනයන් තහනම් කර ඇති අංශයන්හි හැර ආයෝජනයන් සඳහා අවසරය ලබාදී ඇත. |
| 2. සමාගම් කොටස් මත කෙරෙන විදේශීය ආයෝජන | විදේශීය | අවසර ලබාදී නොමැත. | සහයෝගී අරමුදල් ඇතුළු අනුමත කළ ඉන්දියානු ආයෝජකයන්හට මුළු ආයෝජන වටිනාකම එ.ජ.ඩොලර් බිලියන 3 ක උපරිමයකට යටත්ව අවසරය ලබාදී ඇත. ඉන්දියානු සංචිත බැංකුවේ අවසරයකින් තොරව තනි පුද්ගලයින් හට වසරකට එ.ජ.ඩොලර් 50,000 දක්වා සමාගම් කොටස් මිලදී ගැනීමට අවසරය ඇත. |
| | දේශීය | සමහර සිමාවන්ට හා බැහැර කිරීම්වලට යටත්ව අනේවාසිකයන් හට සියයට සියයක් වූ හිමිකම් ප්‍රාග්ධනයේ ආයෝජනය කිරිමට හැකියාව ඇත. | අනුමත කළ සිමාවන් දක්වා කොටස් වෙළෙඳපොළ ආයෝජන යෝජනා ක්‍රමය යටතේ, ඉන්දියානු සුරැකුම්පත් හා විනිමය මණ්ඩලය විසින් අනුමත කළ ආයතනිකමය ආයෝජකයන් සහ අනේවාසික ඉන්දියානුවන් හට සමාගම් කොටස් වල ආයෝජනයට අවසරය ලබාදී ඇත. |
| 3. රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය | විදේශීය | අවසර ලබාදී නොමැත. | සහයෝගී අරමුදල් අතුළුව අනුමත කළ ඉන්දියානු ආයෝජකයන් හට මුළු ආයෝජන වටිනාකම එ.ජ.ඩොලර් බිලියන 3 ක උපරිම සීමාවට යටත්ව ආයෝජනය කිරීමට අවසර ලබාදී ඇත. |
| | දේශීය | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කළ විදේශීය අරමුදල් වලට ඕනෑම අවස්ථාවක නොපියවා ඇති රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල වටිනාකමින් සියයට 5 ක උපරිම සීමාවක් දක්වා මිලදී ගැනීමට අවසරය ලබාදි ඇත. ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කරවල(SLDBs) වල ආයෝජනය කිරීමට අනේවාසි-කයන්හට අවසරය ලබාදී ඇත. | මුළු ආයෝජන වල වටිනාකම එ.ජ.ඩොලර් බිලියන 2.6 ක උපරිමයකට යටත්ව රජයේ සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමට· විදේශීය අරමුදල් වලට අවසරය ලබාදී ඇත. 2007 වසරේ මාර්තු මසදී මෙම සිමාව එ.ජ.ඩොලර් බිලියන 3.2 දක්වා ඉහළ දමනු ඇත. |
| 4. විදේශීය වාණිජමය ණය ලබාගැනීම | | අවස්ථානුකූලව විදේශීය වාණිජමය ණය ලබා ගැනීමට අවසරය ලබාදේ. | වසරකට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 750 ක උපරිම සිමාවකට යටත්ව සමාගම්වලට විදේශීය වාණිජමය ණය ලබාගත හැක. |
| 5. පුද්ගලික මූල්‍ය ප්‍රාග්ධන සංක්‍රාම | | අවසර ලබාදී නොමැත. | ජංගම සහ ප්‍රාග්ධන ගිණුම් ගණුදෙනු සඳහා එ.ජ.ඩොලර් 50,000 ක උපරිමයකට යටත්ව සෑම පුද්ගලයෙකුහටම නිදහසේ ප්‍රේෂණය කිරීමට අවසරය ලබාදී ඇත. |

**නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මකවීමේ ප්‍රතිඵලයක් ලෙස, 2005 දී සියයට 4.3 ක් වූ තීරු බදුවල සාමාන්‍ය අගය, 2006 දී සියයට 4.2 ක් දක්වා පහත වැටිණි.** ප්‍රධාන වෙළෙඳ ප්‍රතිපත්ති නිර්නායකය වන තීරු බදු, සියයට 0, 2.5, 6, 15 සහ 28 යන ආකාරයෙන් කොටස් 5 කින් යුක්ත වූ බදු ව්‍යුහයක් ලෙස 2006 දී පැවතිණි. ඒ අනුව, මූලික අමු ද්‍රව්‍ය සඳහා අවම තීරු බදු අනුපාතයන් ක්‍රියාත්මක වූ අතර, අන්තර් සහ නිමි භාණ්ඩ සඳහා මධ්‍යස්ථ සහ ඉහළ තීරු බදු අනුපාතයන් පිළිවෙලින් ක්‍රියාත්මක කෙරිණි. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා අදාළ තීරු බදු, 2006 වසරේ අවස්ථා කිහිපයකදීම වෙනස්වීම්වලට භාජනය විය. මූල්‍ය ක්‍රමයේ ස්ථාවරභාවය පවත්වා ගැනීම පිළිබඳව සැළකිලිමත්වෙමින්, අත්‍යවශ්‍ය නොවන ද්‍රව්‍ය ආනයනයේදී නිසි පරිදි සොයා බැලීමකින් තොරව ණය ලබාදීම වළක්වනු පිණිස සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලදි. එවැනි අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනයේ දී, ණයවර ලිපි විවෘත කරන හා ප්‍රතිග්‍රහණ ලිපි නිකුත් කරන අවස්ථාවන්හිදී, සියයට 50 ක ආන්තික තැන්පතුවක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවයකට යටත් කරන ලදී. සියයට 10 ක රේගු බදු අධිභාරය, එකතු කළ අගය මත බද්ද, වරාය සහ ගුවන් තොටුපොල සංවර්ධන බද්ද, සමාජ වගකීම් ගාස්තු, මත්පැන්, දුම්කොළ නිෂ්පාදන හා රථවාහන සඳහා අදාළ වන නිෂ්පාදන බදු සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ මත පනවන ලද සෙස් බද්ද යනාදිය ආනයන සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ අනෙකුත් බදු අතර විය.

**5.2 සංඛ්‍යා සටහන**

**සාමාන්‍ය ආනයන බදු එකතු කිරීමේ අනුපාත (අ)**

| ශීර්ෂය | 2002 | 2003 | 2004 | 2005 | 2006 (ආ) |
|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **13.1** | **13.5** | **10.4** | **10.4** | **11.2** |
| ආහාර හා පාන වර්ග | 14.1 | 14.2 | 8.5 | 9.6 | 10.7 |
| සහල් | 32.9 | 29.3 | 4.9 | 10.6 | 23.4 |
| පිටි | 12.3 | 11.5 | 7.2 | 3.8 | 33.7 |
| සීනි | 14.4 | 16.8 | 4.6 | 1.5 | 1.9 |
| තිරිඟු හා ධාන්‍ය | 0.0 | 0.0 | 0.1 | 1.1 | 5.6 |
| කිරි හා කිරි නිෂ්පාදන | 11.9 | 12.2 | 7.9 | 10.2 | 9.6 |
| කරවල | 7.9 | 10.8 | 5.9 | 5.9 | 5.0 |
| වෙනත් මාළු නිෂ්පාදන | 6.8 | 7.9 | 10.0 | 9.8 | 7.8 |
| වෙනත් | 22.9 | 22.3 | 17.4 | 22.0 | 24.2 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 12.1 | 13.0 | 12.2 | 11.1 | 11.7 |
| මෝටර් රථ හා යතුරු පැදි | 23.3 | 22.1 | 21.1 | 18.9 | 18.3 |
| ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර | 8.6 | 8.9 | 9.4 | 13.6 | 7.1 |
| රබර් ටයර් හා ටියුබ් | 27.9 | 26.0 | 25.8 | 26.2 | 19.2 |
| බෙහෙත් හා ඖෂධ නිෂ්පාදන | 0.6 | 0.6 | 0.6 | 0.5 | 0.3 |
| වෙනත් | 9.4 | 9.2 | 8.9 | 8.7 | 10.3 |
| **අන්තර් භාණ්ඩ** | **1.6** | **1.5** | **1.9** | **1.9** | **1.4** |
| පොහොර | 0.4 | 2.6 | 3.1 | 2.7 | 2.5 |
| බොරතෙල් | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 |
| වෙනත් ඛනිජ තෙල් | 0.8 | 0.8 | 0.9 | 0.9 | 1.3 |
| රසායන ද්‍රව්‍ය හා සංයෝග | 1.1 | 2.2 | 2.6 | 2.0 | 1.8 |
| ඩයි වර්ග, පදම් කිරීමේ හා වර්ණ වර්ග | 4.0 | 4.6 | 4.5 | 4.4 | 2.6 |
| කඩදාසි | 5.2 | 5.4 | 6.0 | 6.0 | 2.4 |
| රෙදිපිළි | 0.1 | 0.1 | 0.0 | 0.1 | 0.1 |
| වෙනත් | 4.3 | 3.3 | 4.3 | 4.5 | 3.3 |
| **ආයෝජන භාණ්ඩ** | **5.5** | **7.2** | **6.1** | **5.8** | **5.2** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 7.4 | 7.7 | 9.0 | 7.8 | 9.2 |
| ගමනාගමන උපකරණ | 11.0 | 12.9 | 11.9 | 9.7 | 7.0 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 3.7 | 5.6 | 3.2 | 3.3 | 3.2 |
| වෙනත් | 3.8 | 4.6 | 5.0 | 5.3 | 3.4 |
| **එකතුව** | **4.8** | **5.3** | **4.5** | **4.3** | **4.2** |

(අ) මුළු තීරුබදු එකතුව මුළු ආනයන වටිනාකමෙහි (පි. ර. ගැ.) ප්‍රතිශතයක් ලෙස

(ආ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම

**සීමිත දේශීය ඉල්ලුමක් සහිත කුඩා ආර්ථිකයක් වූ ශ්‍රී ලංකාව වැනි රටකට, දේශීය ආර්ථිකය, ලෝක වෙළෙඳපොළ සමග බද්ධ වන ආකාරයේ විදේශීය වෙළෙඳ සබඳතා සහ ප්‍රතිපත්ති අනුගමනය කිරීම හැර වෙනත් විකල්පයක් නොමැත.** අඛණ්ඩව වර්ධනය වන ජාත්‍යන්තර ඉල්ලුම, තාක්ෂණික සංවර්ධනය සහ නිපුණතා හා නව දැනුම සංක්‍රමණය තුළින් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභයන් අත්කර ගැනීමට මෙවැනි ප්‍රතිපත්තීන් උපකාරී වනු ඇත. ශ්‍රී ලංකාව, බහුපාර්ශ්වික වෙළෙඳාම් ක්‍රමය සඳහා තවදුරටත් පූර්ණව කැප වී සිටින අතර, ජාත්‍යන්තර වෙළෙඳ සංවිධානය විසින් සංවිධානය කරන ලද නිදහස් වෙළෙඳාම උදෙසා වන සාකච්ඡාවලදී ක්‍රියාකාරීව සහභාගී විය.

**2006 වසරේ දී ශ්‍රී ලංකාව කලාපීය සහ ද්විපාර්ශ්වික වෙළෙඳ සබඳතා තවදුරටත් පුළුල් කිරීම ඔස්සේ, ප්‍රගතියක් අත්කර ගත්තේය.** කලාපීය වෙළෙඳ සබඳතා සැලකූ විට, දකුණු ආසියානු නිදහස් වෙළෙඳ කලාප ගිවිසුම (SAFTA) යටතේ, වෙළෙඳ කටයුතු ලිහිල් කිරීමේ පළමු පියවර 2006 ජූලි මාසයේ දී ආරම්භ කෙරිණි. මීට ඉහත දී, බැංකොක් වෙළෙඳ ගිවිසුම ලෙස හඳුන්වනු ලැබූ සය සාමාජික ආසියානු පැසිපික් වෙළෙඳ ගිවිසුමට, 2001 වසරේ දී චීනයද ඇතුළත් වීමත් සමඟ ගිවිසුමට නව ජීවයක් ගෙනදීමට කටයුතු කළේය. බහු-කෙඳි ගිවිසුම අහෝසිවීමත් සමග ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි පැවැති ඇඩි තරඟකාරීත්වය මධ්‍යයේ වුවද, ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් යටතේ ලබා දුන් තීරු බදු ඉවත් කිරීම සහ තීරු බදු අඩු කිරීම වැනි සහන, විදේශීය අංශයේ වර්ධන උපනතීන් අඛණ්ඩව පවත්වාගෙන යාමට උපකාරී විය. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමේ තීරු බදු නිදහස් කිරීමේ දෙවන පියවර යටතේ, වාරණ ලැයිස්තුවට අයත් නොවන භාණ්ඩ තීරු බදු රහිතව ඉන්දියාවට අපනයනය කිරීමට 2003 මාර්තු මාසයේ සිට ශ්‍රී ලංකාවට අවස්ථාව ලැබී තිබිණි. කෙසේ නමුත්, ශ්‍රී ලංකාව විසින් ඉන්දියාවට කරනු ලබන අපනයන, භාණ්ඩ කිහිපයක් මත පමණක් සංකේන්ද්‍රණය වී ඇත. ඉන්දියාවෙන් ආනයනය කරනු ලබන, වාරණ ලැයිස්තුවට අයත් නොවන සියළු භාණ්ඩ සඳහා, 2006 වසරේ දී

ශ්‍රී ලංකාව විසින් සියයට 70 ක තීරු බදු අඩු කිරීමක් ලබා දී ඇත. 2006 දී ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර අපනයන හා ආනයන ඇතුළුව මුළු විදේශීය වෙළෙඳාම, එ.ජ.ඩොලර් බිලියන 2.7 ක් දක්වා සියයට 11 කින් ඉහළ ගියේය. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර යෝජිත විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම (CEPA) යටතේ තාක්ෂණික මට්ටමේ සාකච්ඡා වට දෙකක් 2006 වසරේ දී පැවැත්විණි. භාණ්ඩ හා සේවා වෙළෙඳාම, මූල්‍යමය සේවා වෙළෙඳාම, ගුවන් සේවා, අයෝජන, ද්විත්ව බදුකරණය සහ ආර්ථික සහයෝගීතාව යන විෂයන් මත මෙම සාකච්ඡා පදනම් විය. දෙරට විසින්ම නිසි ප්‍රතිලාභ අත්කර ගැනීමේ අවශ්‍යතාවය පදනම් කරගෙන, 2007 වසර අවසාන වීමට, ප්‍රථම විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම ක්‍රියාවට නැංවීම උදෙසා සාකච්ඡා පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය දෙපාර්ශ්වය විසින්ම අවධාරණය කර ඇත. පකිස්ථාන්-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ද, ශ්‍රී ලංකාවේ අපනයන සඳහා, 2006 දී සියයට 67 ක තීරු බදු අඩු කිරීමක් ලබා දී තිබුණි. පළතුරු, තේ, රබර්, පොල් සහ ඇවමය නිෂ්පාදනවල ඉහළ ක්‍රියාකාරිත්වයක් පෙන්වමින්, පකිස්ථානයට කරනු ලබන අපනයන සියයට 46 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ ලබාදුන් තීරුබදු සහන, යුරෝපීය සංගමයේ විවිධ රටවල වෙළෙඳපොළ පුළුල් කිරීමට මෙන්ම, එම වෙළෙඳපොළවලට කරනු ලබන අපනයන විවිධාංගීකරණය කිරීමට ද උපකාරී විය. වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය යටතේ ලැබුණු තීරු බදු සහන හේතුවෙන්, තියුණු තරඟකාරීත්වයක් මධ්‍යයේ වුවද, යුරෝපීය සංගමයේ රටවලට කරනු ලැබූ ඇඟළුම් අපනයන, සියයට 17.3 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමයේ පවතින දැඩි සහ සංකීර්ණ ප්‍රභවස්ථාන නීති හේතුවෙන්, 2006 දී යුරෝපා සංගමය තුළට මෙම සහන යටතේ, ශ්‍රී ලංකාවෙන් අපනයනය කළ ඇඟළුම් ප්‍රමාණය පහළ මට්ටමට පැවතිණි. රජයේ ඉල්ලීමට අනුව, යුරෝපා සංගමය විසින් ප්‍රභවස්ථාන නීති වෙනස් කිරීම නිසා ඇති විය හැකි බලපෑම පිළිබඳ තක්සේරු කිරීමට, අධ්‍යයන කණ්ඩායමක් පිහිටු වීය. යුරෝපීය සංගමය විසින් දැනට පවත්නා වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය, 2008 දෙසැම්බර් මාසයේදී යළිත් විවරණය කිරීමට නියමිතය.

රජය විසින් නොයෙකුත් ආකාරයේ පහසුකම් තුළින් අපනයනකරුවන්ට සහන සැලසීම අඛණ්ඩව සිදුකළේය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මෙම කාර්යය සඳහා සහභාගි වූ ප්‍රධාන ආයතන විය. භාණ්ඩවල ප්‍රමිතිකරණය, ගුණාත්මකභාවය ආරක්‍ෂා කිරීම සහ තත්ත්ව සහතික සැපයීම මගින් රටවල් දෙක අතර වෙළෙඳාමට පහසුකම් සැපයීම සඳහා, 2006 දී, ඉන්දියානු ප්‍රමිති කාර්යාංශය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ද්විපාර්ශ්වික සහයෝගීතා ගිවිසුමකට එළඹිණි.

නැගී එන තරඟකාරීත්වය හමුවේ සාර්ථකව මුහුණ දෙමින්, රෙදිපිළි හා ඇඟළුම් අංශයේ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා රජය විසින් ක්‍රියා මාර්ග කිහිපයක්ම ගනු ලැබීය. අන්තර් භාණ්ඩ සැපයුම් කරන දේශීය සැපයුම්කරුවන් වෙත පනවා තිබූ එකතු කළ අගය මත බදු අඩු කිරීම, නව තාක්ෂණය අත්පත් කර ගැනීම සඳහා තීරු බදු සහන ලබාදීම, තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා මූල්‍යමය ආධාර ලබාදීම, එකතුකළ අගය මත බදු ක්‍රමය සරල කිරීම, ඇඟළුම් මිලදී ගැනීමේ මධ්‍යස්ථාන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම, රෙදිපිළි නිෂ්පාදනය පිළිබඳ පුහුණු කිරීමට ආයතනයක් පිහිටුවීම, ඇඟළුම් කර්මාන්තයේ සිරස් ඒකරාශිකරණය සඳහා ආයක වීම, රෙදිපිළි නිෂ්පාදනය නොකිරීම නිසා දැනට ක්‍රියාත්මක නොවන ආයතන යළි ආරම්භ කිරීම යටතේ අනුගමනය කරන ලද ක්‍රියා මාර්ග අතර වේ. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ඇති දැඩි තරඟකාරීත්වය හමුවේ වුවද, දැනට ක්‍රියාත්මක නොවන රෙදිපිළි නිෂ්පාදන කර්මාන්ත ශාලා මෙලෙස යළි නගා සිටුවීම සඳහා, ප්‍රධාන පෙළේ අපනයනකරුවන් විසින් විශාල වශයෙන් ආයෝජනය කිරීමට කැමැත්ත දැක්වීම, කර්මාන්තයේ අනාගතය පිළිබඳ යහපත් බලාපොරොත්තු ඇති කරන අතර, කර්මාන්තයේ අනාගතය පිළිබඳ පුළුල් විශ්වාසනීයත්වයක් ද ගොඩ නැගීමට හේතු වේ. "පිළිගත් ප්‍රමිතීන් යටතේ නිපැයූ ඇඟළුම්" (Garments Without Guilt) යන ශීර්ෂ පාඨය ඔස්සේ ඇඟළුම් ඉදිරිපත් කරමින්, ජාත්‍යන්තර වෙළෙඳපොළේ නව වෙනසක් ඇති කිරීමට ඇඟළුම් කර්මාන්තයේ අදාළ කොටස්කරුවන් පියවර ගෙන ඇත. ළමා ශ්‍රමය යොදා නොගනිමින් සහ කාන්තාවන් සවිබල ගැන්වීම වැනි සදාචාරාත්මක ගුණයන් පවත්වා ගනිමින් කටයුතු කරන ඇඟළුම් සපයන්නකු වීම කෙරෙහි වැඩි අවධානයක් යොමුව ඇත. ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය විසින් චීනයේ නිෂ්පාදිත ඇඟළුම් සඳහා පනවා ඇති නොයෙකුත් සීමාකම් ලිහිල් කිරීමේදී කර්මාන්තයට මුහුණ පෑමට සිදුවන තරඟකාරීත්වයට මුහුණ දීමට සූදානම් වීම මෙම ක්‍රියා මාර්ගයන්ගේ අරමුණ වේ.

## 5.3 භාණ්ඩ වෙළෙඳාම, වෙළෙඳ ශේෂය සහ වෙළෙඳ අනුපාතය

### අපනයන ක්‍රියාකාරීත්වය

අපනයනවල ගුණාත්මකභාවය වැඩි වීම, අපනයන ගමනාන්ත රටවල පැවති ආර්ථික සමෘද්ධිමත්භාවය, ලෝක ආර්ථිකය සමඟ දේශීය ආර්ථිකය තවදුරටත් බද්ධ වීම තුළින් ජාත්‍යන්තර වෙළෙඳපොළ පුළුල්වීම සහ

**5.3 සංඛ්‍යා සටහන**

## වෙළෙඳ දර්ශක (අ)

1997=100

| ශීර්ෂය | 2005 | | | 2006 (ආ) | | | වර්ධන වේගය (ආ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම් දර්ශකය | පරිමා දර්ශකය | ඒකක වටිනාකම් දර්ශකය | වටිනාකම් දර්ශකය | පරිමා දර්ශකය | ඒකක වටිනාකම් දර්ශකය | වටිනාකම් දර්ශකය | පරිමා දර්ශකය | ඒකක වටිනාකම් දර්ශකය |
| අපනයන | | | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **108.6** | **116.1** | **93.5** | **121.7** | **122.6** | **99.3** | **12.1** | **5.6** | **6.2** |
| තේ | 112.4 | 117.3 | 95.8 | 122.2 | 124.0 | 98.6 | 8.7 | 5.7 | 2.9 |
| රබර් | 59.7 | 53.9 | 110.7 | 118.4 | 77.0 | 153.8 | 98.2 | 42.8 | 38.9 |
| පොල් | 96.3 | 102.3 | 94.1 | 105.3 | 112.4 | 93.7 | 9.3 | 9.8 | -0.4 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 126.5 | 155.6 | 81.3 | 134.2 | 148.7 | 90.2 | 6.1 | -4.4 | 11.0 |
| **කාර්මික අපනයන** | **143.7** | **145.4** | **98.9** | **156.1** | **150.7** | **103.6** | **8.6** | **3.7** | **4.7** |
| රෙදිපිළි හා ඇඟළුම් | 127.0 | 134.4 | 94.5 | 135.2 | 141.2 | 95.7 | 6.4 | 5.1 | 1.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 134.5 | 54.4 | 247.4 | 192.2 | 69.3 | 277.3 | 42.9 | 27.4 | 12.1 |
| වෙනත් | 180.3 | 177.1 | 101.8 | 197.6 | 178.5 | 110.7 | 9.6 | 0.8 | 8.7 |
| ඛනිජ ද්‍රව්‍ය අපනයන | 160.4 | 115.5 | 138.8 | 152.4 | 120.7 | 126.3 | -5.0 | 4.5 | -9.0 |
| මැණික් | 144.9 | 115.7 | 125.3 | 143.9 | 119.9 | 120.0 | -0.7 | 3.6 | -4.2 |
| වෙනත් | 365.0 | 144.1 | 319.8 | 264.8 | 130.3 | 203.2 | -27.5 | -9.6 | -36.5 |
| **මුළු අපනයන** | **136.6** | **138.0** | **98.9** | **148.1** | **143.6** | **103.1** | **8.4** | **4.1** | **4.2** |
| ආනයන | | | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **138.6** | **159.8** | **86.7** | **164.4** | **175.9** | **93.5** | **18.6** | **10.1** | **7.8** |
| ආහාර හා පාන වර්ග | 95.2 | 101.3 | 94.0 | 118.0 | 108.7 | 108.5 | 23.9 | 7.3 | 15.5 |
| වෙනත් | 201.7 | 244.9 | 82.4 | 231.8 | 273.5 | 84.8 | 14.9 | 11.7 | 2.9 |
| **අන්තර් භාණ්ඩ** | **168.7** | **139.3** | **121.1** | **191.6** | **146.2** | **131.0** | **13.5** | **5.0** | **8.2** |
| පොහොර | 203.3 | 135.7 | 149.8 | 247.1 | 162.1 | 152.5 | 21.6 | 19.4 | 1.8 |
| බොර තෙල් | 292.7 | 110.7 | 264.4 | 389.4 | 118.6 | 328.3 | 33.0 | 7.1 | 24.2 |
| අනෙකුත් ඛනිජ තෙල් | 320.4 | 132.5 | 241.8 | 378.0 | 143.5 | 263.5 | 18.0 | 8.3 | 9.0 |
| රසායනික ද්‍රව්‍ය සහ සංයෝග | 182.8 | 143.2 | 127.6 | 191.8 | 144.2 | 133.0 | 4.9 | 0.7 | 4.2 |
| තිරිඟු සහ ධාන්‍ය | 102.6 | 109.5 | 93.7 | 144.1 | 152.1 | 94.8 | 40.5 | 38.9 | 1.1 |
| රෙදිපිළි | 110.4 | 131.8 | 83.8 | 111.5 | 133.7 | 83.4 | 1.0 | 1.5 | -0.5 |
| ප්ලාස්ටික් | 201.7 | 176.3 | 114.4 | 225.4 | 172.3 | 130.8 | 11.8 | -2.3 | 14.3 |
| දියමන්ති | 192.5 | 139.4 | 138.1 | 193.2 | 116.6 | 165.8 | 0.4 | -16.4 | 20.0 |
| වෙනත් | 183.4 | 181.6 | 101.0 | 212.6 | 202.7 | 104.9 | 15.9 | 11.6 | 3.9 |
| **ආයෝජන භාණ්ඩ** | **141.0** | **180.0** | **78.3** | **169.3** | **195.9** | **86.4** | **20.1** | **8.8** | **10.4** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 186.6 | 190.9 | 97.8 | 201.0 | 197.3 | 101.9 | 7.7 | 3.4 | 4.2 |
| ප්‍රවාහන උපකරණ | 156.3 | 104.8 | 149.2 | 179.5 | 102.0 | 175.9 | 14.9 | -2.6 | 17.9 |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 115.7 | 204.4 | 56.6 | 144.7 | 231.3 | 62.5 | 25.0 | 13.2 | 10.5 |
| වෙනත් | 171.8 | 127.6 | 134.6 | 243.3 | 126.0 | 193.1 | 41.6 | -1.2 | 43.4 |
| **මුළු ආනයනය** | **151.1** | **152.8** | **98.9** | **174.8** | **163.6** | **106.9** | **15.7** | **7.1** | **8.0** |
| වෙළෙඳ අනුපාතය | | | 100.0 | | | 96.5 | | | -3.5 |

(අ) එ.ජ. ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

රජය හා ප්‍රධාන අපනයනකරුවන් විසින් පවත්වා ගනු ලැබූ වාණිජමය සම්බන්ධතා සහ නොයෙකුත් ආරම්භක පියවර තුළින් ශක්තිමත් වෙමින්, 2006 දී අපනයන තවදුරටත් අඛණ්ඩව වර්ධනය විය. අපනයන මිල ගණන් සහ අපනයන පරිමාව ඉහළ යාම ප්‍රතිඵලයක් ලෙස, අපනයන ඉපැයුම්, එ. ජ. ඩොලර් දශ ලක්ෂ 6,833 දක්වා සියයට 8.4 කින් වැඩි විය.

පසුගිය වසර සමග සසඳනවිට, 2006 දී අපනයනවල සංයුතිය නොවෙනස්ව පැවතිණ. 2006 දී කාර්මික අපනයන සියයට 8.8 කින් වර්ධනය විය. දැඩි ජාත්‍යන්තර තරඟකාරීත්වය හමුවේ වුවද, 2006 දී ඇඟළුම් අපනයන සියයට 6.4 කින් වර්ධනය විය. ඇමෙරිකා එක්සත් ජනපදයට අපනයන කළ ඇඟළුම් ආන්තික වශයෙන් අඩු වුවද, වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ ලැබුණු සහනයන් නිසා, යුරෝපා සංගමයේ

**5.4 සංඛ්‍යා සටහන**

## අපනයන සංයුතිය


| කාණ්ඩය | 2005 වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ | 2005 දායකත්වය % | 2006 (අ) වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ | 2006 (අ) දායකත්වය % | වටිනාකමේ වෙනස (අ) එ.ජ. ඩොලර් දශලක්ෂ | වර්ධන වේගය (අ) % | වර්ධනයට වූ දායකත්වය (අ) % |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | **1,153.8** | **18.2** | **1,292.7** | **18.8** | **138.9** | **12.0** | **25.8** |
| තේ | 810.2 | 12.8 | 881.2 | 12.8 | 71.0 | 8.8 | 13.2 |
| රබර් | 46.9 | 0.7 | 93.1 | 1.4 | 46.2 | 98.5 | 8.6 |
| පොල් | 113.3 | 1.8 | 123.8 | 1.8 | 10.5 | 9.3 | 1.9 |
| මද නිෂ්පාදන | 48.8 | 0.8 | 52.8 | 0.8 | 4.0 | 8.2 | 0.7 |
| වෙනත් | 64.5 | 1.0 | 71.0 | 1.0 | 6.5 | 10.1 | 1.2 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 183.4 | 2.9 | 194.6 | 2.8 | 11.2 | 6.1 | 2.1 |
| **කාර්මික අපනයන** | **4,948.4** | **78.0** | **5,383.4** | **78.3** | **435.0** | **8.8** | **81.2** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 318.2 | 5.0 | 363.9 | 5.3 | 45.7 | 14.4 | 8.5 |
| රෙදිපිළි හා ඇඟළුම් | 2,894.6 | 45.6 | 3,080.3 | 44.8 | 185.8 | 6.4 | 34.7 |
| ඛනිජ නිෂ්පාදන | 130.9 | 2.1 | 187.2 | 2.7 | 56.3 | 43.0 | 10.5 |
| රබර් නිෂ්පාදන | 394.4 | 6.2 | 427.5 | 6.2 | 33.1 | 8.4 | 6.2 |
| පිඟන් නිෂ්පාදන | 47.1 | 0.7 | 47.4 | 0.7 | 0.3 | 0.6 | 0.1 |
| සම්, සංචාරක භාණ්ඩ හා සපත්තු | 43.8 | 0.7 | 40.6 | 0.6 | -3.2 | -7.3 | -0.6 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 329.9 | 5.2 | 394.3 | 5.7 | 64.4 | 19.5 | 12.0 |
| දියමන්ති හා ස්වර්ණාභරණ | 277.9 | 4.4 | 327.0 | 4.8 | 49.1 | 17.7 | 9.2 |
| වෙනත් | 511.7 | 8.1 | 515.2 | 7.5 | 3.5 | 0.7 | 0.7 |
| **ඛනිජ අපනයන** | **143.3** | **2.2** | **136.2** | **1.9** | **-7.1** | **-5.0** | **-1.3** |
| මැණික් | 120.3 | 1.8 | 119.5 | 1.7 | -0.8 | -0.7 | -0.1 |
| වෙනත් | 23.0 | 0.4 | 16.7 | 0.2 | -6.3 | -27.4 | -1.2 |
| **වර්ග නොකළ අපනයන (ආ)** | **101.2** | **1.6** | **70.4** | **1.0** | **-30.8** | **-30.4** | **-5.7** |
| **මුළු අපනයන (ඇ)** | **6,346.7** | **100.0** | **6,882.7** | **100.0** | **536.0** | **8.4** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය** | 100.50 | | 103.96 | | | | |

(අ) තාවකාලික
(ආ) ප්‍රති අපනයන ඇතුළත් ය
(ඇ) ගලපන ලද

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් ද්‍රව්‍ය අපනයනකරුවෝ
ශ්‍රී ලංකා මහ බැංකුව
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

රටවලට කළ ඇඟළුම් ඇතුළුව අපනයන සියයට 18.4 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. යුරෝපා සංගමයේ පැවැති අපනයන වර්ධනය, එක්සත් රාජධානිය, ඉතාලිය, ජර්මනිය, ප්‍රංශය සහ නෙදර්ලන්තය යන රටවල වෙළෙඳපොළ ප්‍රසාරණයවීම තුළින් පිළිබිඹු විය. 2006 දී රබර් ආශ්‍රිත නිෂ්පාදනයන්හි වර්ධනයක් පෙන්නුම් කළ ද, අමු ද්‍රව්‍ය මිලෙහි ඇති වූ ඇඩි උච්ඡාවචනයන්හි ප්‍රතිඵලයක් ලෙස මෙම අංශය, යම් පසුබෑමකට ලක් විය. 2005 දී ආහාර සහ පාන වර්ග කැපී පෙනෙන ලෙස වර්ධනය වූවද, ඉන්දියාවට අපනයනය කළ වනස්පති ද්‍රව්‍යයන් අඩුවීම නිසා, 2006 දී අපනයන යම් බලපෑමට ලක් වීමට හේතු විය. තේ සහ රබර්වල ඉහළ ක්‍රියාකාරීත්වය ඔස්සේ, 2006 දී කෘෂිකාර්මික අංශයේ අපනයනයන් ද ඉහළ ගියේය. කෙන්යාවේ පැවති නියඟය හේතුවෙන් ලෝක වෙළෙඳපොළෙහි තේ සැපයුමේ වූ පසුබෑම සහ ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලයීය (CIS) සහ මැද පෙරදිග රටවලින් නිර්මාණය වූ ඉහළ ඉල්ලුම තුළින්, ඇති වූ වාසිදායක තත්ත්වය තුළින් තේ අපනයන වාර්තාගත ලෙස ඉහළ ගියේය. කෙසේ වුවද, ජෝර්දානය, ඉරානය සහ ලිබියාවට අපනයනය කළ තේ අඩුවීමෙන්, එකතු කළ වටිනාකමක් සහිත තේ අපනයන පහළ ගියේය. 2006 දී, රබර් මිල ගණන් සහ පරිමාව වැඩිවීම පිළිබිඹු කරමින් රබර් අපනයන ද වැඩි විය. ඉහළ ගිය ඛනිජ තෙල් මිල සමග, 2006 දී රබර් මිල ද ඓතිහාසික ලෙස ඉහළ ගියේය. ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල, කාලගුණික තත්ත්වය, ඉදිරි ගනුම් හා සම්බන්ධ කටයුතු, ප්‍රධාන ගැනුම්කරුවන්ගෙන් ඇති වන ඉල්ලුම, සමස්ත ගෝලීය නිෂ්පාදනය සහ පවත්නා තොග ප්‍රමාණවලට ප්‍රතිචාරීව ලෝක වෙළෙඳපොළෙහි ස්වාභාවික රබර්වල මිල, 2006 දී ඇඩි උච්චාවචනයට භාජනය විය. පළතුරු, ගම්මිරිස්, කුරුඳු සහ සකස් නොකළ දුම්කොළවල ඉහළ අපනයනයන් පිළිබිඹු කරමින් අනෙකුත් කෘෂිකාර්මික අපනයන ද ඉහළ ගියේය. ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ තීරු බදු රහිතව ඉන්දියානු වෙළෙඳපොළට පිවිසීමට ඇති හැකියාව සහ මැද පෙරදිග රටවලින් වර්ධනය වූ ඉල්ලුම තුළින් නිර්මාණය වූ වෙළෙඳ පසුබිම මෙම නිෂ්පාදනවලට ඇති විදේශීය ඉල්ලුම වැඩි කළේය.

**5.3 රූප සටහන** ප්‍රධාන කාණ්ඩ අනුව අපනයන සංයුතිය




## ආනයන ක්‍රියාකාරීත්වය


**ආනයන ඉල්ලුම සහ ආනයන මිල ගණන් ඉහළ යාම පිළිබිඹු කරමින්, 2006 දී ආනයන එ.ජ.ඩොලර් දශලක්ෂ 10,253 දක්වා සියයට 15.7 කින් වර්ධනය විය.** කාර්මික හා සැකසුම් කටයුතුවල ඇති වූ වර්ධනය, දිගුකල් පවතින පාරිභෝගික භාණ්ඩ සඳහා අඛණ්ඩව පැවති ඉහළ ඉල්ලුම සහ සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවති පොලී අනුපාතිකය යනාදි කරුණු 2006 දී අන්තර්, ආයෝජන සහ පාරිභෝගික භාණ්ඩ යන ප්‍රධාන ආනයන කාණ්ඩ තුනෙහිම වර්ධනයට බලපෑවේය.

**2006 වසරේ දී, අන්තර් භාණ්ඩ ආනයනයන් සියයට 12.1 කින් වර්ධනය වීමට ඛනිජ තෙල් නිෂ්පාදන මූලික විය.** ඛනිජ තෙල් මිල ඉහළ යාම පළමු කාර්තු තුනෙහි අන්තර් භාණ්ඩ ආනයනවල ශීඝ්‍ර වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපෑවේය. මෙම කාලය තුළ, බොරතෙල්වල සාමාන්‍ය ආනයනික මිල සියයට 32.8 කින් වර්ධනය විය. කෙසේ වෙතත්, 2006 වසරේ සිව්වන කාර්තුවේ දී ලෝක වෙළෙඳපොළෙහි තෙල් මිල පහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස, අන්තර් භාණ්ඩ ආනයන වර්ධනය වූයේ සියයට 4.3 කින් පමණි. 2005 වර්ෂයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,655 ක් වූ ඛනිජ තෙල් ආනයන, 2006 දී එ.ජ.ඩොලර් දශලක්ෂ 2,070 දක්වා සියයට 25.0 කින් වර්ධනය වූ අතර එය සමස්ත ආනයනයෙන් සියයට 20 ක් විය. මේ අතර, කාර්මික අංශයේ වූ වර්ධනය පිළිබිඹු කරමින් ඛනිජ තෙල් හැරුණුවිට අනෙකුත් අන්තර් භාණ්ඩ සියයට 6.3 කින් වර්ධනය විය. 2006 වසර තුළ දී, රෙදිපිළි, රසායනික ද්‍රව්‍ය, දියමන්ති, කඩදාසි සහ රබර් ආශ්‍රිත කර්මාන්ත සඳහා අවශ්‍ය භාණ්ඩ ආනයනය ද ඉහළ ගියේය.

**2006 වසර තුළ දී ඛනිජ තෙල් නොවන ආනයන භාණ්ඩ අතර, ආයෝජන භාණ්ඩ වේගවත් වර්ධනයක් පෙන්වීය.** පසුගිය වසරවල දී අඛණ්ඩව වර්ධනය වූ ආයෝජන භාණ්ඩ ආනයන, 2005 දී වාර්තා වූ සියයට 12.0 ක වර්ධන වේගය ද අභිබවමින්, 2006 දී සියයට 20.1 කින් වර්ධනය විය. රජය මගින් දියත් කළ කඩිනම් සංවර්ධන ව්‍යාපෘති සහ විශේෂයෙන්ම ඉදිකිරීම්, විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණික යන අංශයන්වල පෞද්ගලික අංශය දියත් කළ ආයෝජන ව්‍යාපෘතීන් හේතුවෙන්, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන සියලුම කාණ්ඩවල ආයෝජන භාණ්ඩ ආනයන ඉහළ ගියේය. තම නිෂ්පාදන ක්‍රියාවලිය නවීකරණය කර ගැනීම සඳහා උසස් තාක්ෂණය යොදාගැනීමට 2006 වසරේ දී රජය විසින් දිරිගැන්වීම් ප්‍රදානය කරන ලදි.

**2006 වසරේ දී, ඉහළ ගිය ආනයන මිල ගණන් සහ භාණ්ඩ සඳහා ඉහළ ගිය ඉල්ලුමත් සමග පාරිභෝගික භාණ්ඩ ආනයන සියයට 20.5 කින් වර්ධනය විය.** සීනි, කිරි නිෂ්පාදන සහ තිරිඟු ද්‍රව්‍යයන්ගේ ඉහළ ගිය ජාත්‍යන්තර මිල ගණන් පිළිබිඹු කරමින් ආහාර හා පාන වර්ග

**5.4 රූප සටහන** ප්‍රධාන කාණ්ඩ අනුව ආනයන සංයුතිය



**5.5 සංඛ්‍යා සටහන**

**ආනයන සංයුතිය**

| කාණ්ඩය | 2005 වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ | 2005 දායකත්වය % | 2006 (අ) වටිනාකම එ.ජ. ඩොලර් දශලක්ෂ | 2006 (අ) දායකත්වය % | වටිනාකමේ වෙනස (අ) එ.ජ. ඩොලර් දශලක්ෂ | වර්ධන වේගය (අ) % | වර්ධනයට වූ දායකත්වය (අ) % |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **1,643.9** | **18.5** | **1,980.2** | **19.3** | **336.3** | **20.5** | **24.2** |
| ආහාර හා පාන වර්ග | 752.6 | 8.5 | 956.0 | 9.3 | 203.4 | 27.0 | 14.6 |
| සහල් | 15.6 | 0.2 | 5.5 | 0.1 | -10.1 | -64.7 | -0.7 |
| සීනි | 132.3 | 1.5 | 223.7 | 2.2 | 91.4 | 69.1 | 6.5 |
| කිරිගු | 141.4 | 1.6 | 198.6 | 1.9 | 57.2 | 40.5 | 4.1 |
| වෙනත් | 463.3 | 5.2 | 528.2 | 5.2 | 64.9 | 14.0 | 4.7 |
| වෙනත් පාරිභෝගික භාණ්ඩ | 891.3 | 10.1 | 1,024.2 | 10.0 | 132.9 | 14.9 | 9.6 |
| **අන්තර් භාණ්ඩ** | **5,317.1** | **60.0** | **5,961.7** | **58.1** | **644.6** | **12.1** | **46.4** |
| ඛනිජ තෙල් | 1,655.2 | 18.7 | 2,069.6 | 20.2 | 414.3 | 25.0 | 29.8 |
| පොහොර | 135.0 | 1.5 | 164.1 | 1.6 | 29.1 | 21.6 | 2.1 |
| රසායනික ද්‍රව්‍ය | 248.6 | 2.8 | 260.8 | 2.5 | 12.2 | 4.9 | 0.9 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1,531.0 | 17.3 | 1,546.2 | 15.1 | 15.2 | 1.0 | 1.1 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 1,747.3 | 19.7 | 1,921.0 | 18.7 | 173.7 | 9.9 | 12.5 |
| **ආයෝජන භාණ්ඩ** | **1,869.6** | **21.1** | **2,245.7** | **21.9** | **376.1** | **20.1** | **27.1** |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 860.4 | 9.7 | 1,075.4 | 10.5 | 215.0 | 25.0 | 15.5 |
| ගමනාගමන උපකරණ | 325.3 | 3.7 | 373.6 | 3.6 | 48.3 | 14.8 | 3.5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 507.0 | 5.7 | 546.2 | 5.3 | 39.2 | 7.7 | 2.8 |
| වෙනත් | 176.9 | 2.0 | 250.5 | 2.4 | 73.6 | 41.6 | 5.3 |
| **වර්ග නොකළ ආනයන** | **32.6** | **0.4** | **65.4** | **0.6** | **32.8** | **100.7** | **2.3** |
| **මුළු ආනයන (ආ)** | **8,863.2** | **100.0** | **10,253.0** | **100.0** | **1,389.8** | **15.7** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය** | 100.50 | | 103.96 | | | | |

(අ) තාවකාලික
(ආ) ගලපන ලද

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ශ්‍රී ලංකා මහ බැංකුව
සීමාසහිත ප්‍රිමා ලංකා සමාගම

ආනයනය සඳහා කළ වියදම වැඩි විය. මෙම උප කාණ්ඩය තුළ ආනයනවලින් සියයට 50 ක ප්‍රමාණයක් සඳහා කිරිගු සහ සීනි දායක විය. 2005 වසරේ දී, කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ උප කාණ්ඩයේ, පෞද්ගලික භාවිතය සඳහා ආනයනය කළ මෝටර් රථ, පහළ යාමක් පෙන්නුම් කළ ද 2006 වසරේ දී එය සැලකිය යුතු වර්ධනයක් පෙන්වීය.

**අපනයන අභිබවා ගිය ආනයන පිළිබිඹු කරමින්, වෙළෙඳ හිඟය 2006 දී තවදුරටත් පුළුල් විය.** 2005 වසරේ දී එ.ජ.ඩොලර් දශලක්ෂ 2,516 (ද.දේ.නි.යෙන් සියයට 10.7) ක් වූ වෙළෙඳ හිඟය හා සසඳන විට 2006 දී එය, එ.ජ.ඩොලර් දශලක්ෂ 3,370 (ද.දේ.නි.යෙන් සියයට 12.5) දක්වා පුළුල් විය.

**අපනයන මිල වැඩිවීමට වඩා වැඩි වේගයෙන් ආනයන මිල ගණන් ඉහළ යාම නිසා 2006 දී වෙළෙඳ අනුපාතය පිරිහීමකට ලක්විය.** ලෝක වෙළෙඳපොළෙහි ඛණිජ තෙල් මිල ගණන් ඉහළ යාම නිසා, ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන වන නැව් හා ගුවන් යානාවලට සපයන ලද තෙල් සහ රබර් අපනයන මිල ගණන් 2006 දී කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. කෙන්යාවේ තේ නිෂ්පාදනයෙහි පෙන්නුම් කළ අඩු ධාරිතාව සහ දේශීය තේවල නොකඩවා වර්ධනය වූ ගුණාත්මකභාවයේ ප්‍රතිඵලයක් ලෙස, තේවල සාමාන්‍ය අපනයන මිල, ජාත්‍යන්තර වෙළෙඳපොළේ පැවැති සාමාන්‍ය මිලගණන් වලට වඩා ඉහළ අගයක පැවතිණි. 2005 වසරේදී බහු-කෙඳි ගිවිසුම අවසන්වීමෙන් වෙළෙඳපොළෙහි ඇතිවූ තරගකාරිත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස ඇඟළුම් මිල යම්තාක් දුරට ඉහළ ගිය ද, තේ රබර් සහ ඛනිජ තෙල් නිෂ්පාදනවල සාමාන්‍ය මිල ගණන් වැඩිවීම නිසා සමස්ථ අපනයන ඒකක මිල දර්ශකය සියයට 4.2 කින් ඉහළ ගියේය. අපනයන පරිමා දර්ශකයද සියයට 4.1 කින් වර්ධනය විය. ඓතිහාසික ලෙස ඛනිජ තෙල් මිල ඉහළයාම, ආනයනවල මිල ඉහළ යාමට හේතු විය. තෙල්වල මිල ඉහළ යාමත් සමග පොහොර, රසායනික නිෂ්පාදන හා සීනිවල මිල ද ඉහළ ගියේය. උක් අස්වැන්නෙන් වැඩි කොටසක් පෙට්‍රල් සඳහා ආදේශකයක් වූ මධ්‍යසාර ජීව ඉන්ධන නිපදවීමට උපයෝගි කර ගැනීම, ලෝක වෙළෙඳපොළෙහි සීනි මිලෙහි ශීඝ්‍ර වර්ධනය වීමට බලපෑවේය. මෙම වසරේදී ලොව පුරා කිරිගු අස්වැන්න අඩුවීමත් සමග පැවැති ඇඩි ඉල්ලුම සහ කිරිගු තොගවල පහළ යාමත් නිසා, දශකයේ පැවැති ඉහළම මිල ගණන් පෙන්නුම් කෙරිණි. මෙම ප්‍රවනතාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස 2006 වසරේදී ආනයන මිල දර්ශකය සියයට 8.0 කින් ද ආනයන පරිමා දර්ශකය සියයට 7.1 කින් ද වර්ධනය විය. ඒ නිසා 2006

**5.6 සංඛ්‍යා සටහන** **ප්‍රධාන ආනයනයන්හි පරිමාවන් (අ)**

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 2002 | 2003 | 2004 | 2005(ආ) | 2006(ඇ) |
|---|---|---|---|---|---|
| **සහල්** | **95** | **35** | **222** | **52** | **12** |
| 1 වන කාර්තුව | 51 | 22 | 9 | 43 | 3 |
| 2 වන කාර්තුව | 9 | 9 | 9 | 4 | 2 |
| 3 වන කාර්තුව | 10 | 2 | 4 | 2 | 3 |
| 4 වන කාර්තුව | 25 | 2 | 200 | 3 | 4 |
| **තිරිඟු** | **993** | **919** | **993** | **864** | **1,200** |
| 1 වන කාර්තුව | 309 | 262 | 257 | 272 | 287 |
| 2 වන කාර්තුව | 215 | 232 | 218 | 191 | 321 |
| 3 වන කාර්තුව | 221 | 217 | 189 | 174 | 331 |
| 4 වන කාර්තුව | 248 | 208 | 329 | 227 | 261 |
| **සීනි** | **554** | **509** | **438** | **418** | **525** |
| 1 වන කාර්තුව | 146 | 151 | 98 | 49 | 112 |
| 2 වන කාර්තුව | 141 | 135 | 173 | 167 | 137 |
| 3 වන කාර්තුව | 110 | 104 | 71 | 94 | 127 |
| 4 වන කාර්තුව | 157 | 119 | 96 | 108 | 149 |
| **ඛනිජ තෙල් (බොර තෙල්)** | **2,300** | **1,995** | **2,200** | **2,008** | **2,151** |
| 1 වන කාර්තුව | 539 | 382 | 586 | 586 | 592 |
| 2 වන කාර්තුව | 513 | 466 | 464 | 581 | 535 |
| 3 වන කාර්තුව | 593 | 500 | 634 | 246 | 582 |
| 4 වන කාර්තුව | 655 | 647 | 516 | 595 | 442 |
| **පිරිපහදු ඛනිජ තෙල්** | **1,348** | **1,168** | **1,645** | **1,823** | **1,763** |
| 1 වන කාර්තුව | 276 | 340 | 460 | 314 | 402 |
| 2 වන කාර්තුව | 426 | 239 | 380 | 396 | 468 |
| 3 වන කාර්තුව | 266 | 317 | 341 | 711 | 334 |
| 4 වන කාර්තුව | 380 | 272 | 464 | 402 | 559 |
| **පොහොර** | **537** | **514** | **510** | **529** | **633** |
| 1 වන කාර්තුව | 103 | 124 | 54 | 168 | 165 |
| 2 වන කාර්තුව | 163 | 166 | 164 | 111 | 203 |
| 3 වන කාර්තුව | 138 | 49 | 76 | 142 | 119 |
| 4 වන කාර්තුව | 133 | 175 | 216 | 107 | 146 |

(අ) ගලපන ලද
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම


වසරේදී වෙළෙඳ අනුපාතිකය සියයට 3.5 කින් පිරිහුණ ද මෙම පිරිහීම, 2005 වසරේදී වාර්තා වූ සියයට 4.2 ක් වූ ප්‍රමාණයට වඩා අඩු අගයකින් යුක්තය.

### වෙළෙඳ දිශාව

**බටහිර රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන ඉල්ලුම්කරුවන් වූ අතර, ආසියානු රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආනයන සැපයුම්කරුවන් විය.** ඇමෙරිකා එක්සත් ජනපදය, ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන ගැනුම්කරු වූ නමුදු, 2005 වසරේ දී සියයට 31 ක් ලෙස පැවති අපනයන ආයකත්වය, 2006 දී සියයට 29 ක් දක්වා ආන්තික වශයෙන් අඩු විය. කලාපය තුළ ඇඟළුම් අපනයනයෙහි පැවති දැඩි තරඟකාරීත්වය පිළිබිඹු කරමින්, ඇමෙරිකා එක්සත් ජනපදයට කළ අපනයන සියයට 0.9 ක සුළු වර්ධනයක් පමණක් පෙන්නුම් කළේය. සියයට 12.8 ක ආයකත්වයක් සහිතව එක්සත් රාජධානිය ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම අපනයන ඉල්ලුම්කරු විය. වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය යටතේ (GSP+) ලැබුණු තීරු බදු සහන තුළින් එක්සත් රාජධානියට කළ අපනයන කැපී පෙනෙන ලෙස වැඩි විය. තෙවන විශාලතම අපනයන ඉල්ලුම්කරු වූයේ ඉන්දියාවය. කෙසේ වුවද, 2005 දී සමස්ත අපනයනයෙන් සියයට 9 කට ආයකත්වය සැපයූ ඉන්දියානු වෙළෙඳපොළ, 2006 දී සියයට 7 දක්වා අඩු වූ අතර, මේ සඳහා බලපෑ ප්‍රධාන කරුණ වූයේ ඉන්දියාවට අපනයනය කළ වනස්පති ද්‍රව්‍යයන්ගේ ප්‍රමාණය අඩුවීමයි. බෙල්ජියම, ජර්මනිය, ඉතාලිය, රුසියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ප්‍රංශය සහ ජපානය ශ්‍රී ලංකාවේ අනිකුත් ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් විය.

**ඉන්දියාවේ ඉහළ ආයකත්වයක් සමඟ, 2006 දී, කලාපයක් ලෙස ගත් විට ආසියානු රටවල් තවදුරටත් ප්‍රධාන ආනයන කලාපය වශයෙන් පැවතින.** ආසියානු කලාපයේ වෙළෙඳපොළ ආයකත්වය, 2006 දී සියයට 60 ක් ලෙස නොවෙනස්ව පැවතිණි. සියයට 21 ක ආයකත්වයක් සහිතව ඉන්දියාව විශාලතම ආනයන ප්‍රභවය වූ අතර ඉන් අනතුරුව සිංගප්පූරුව (සියයට 10), චීනය (සියයට 8), ඉරානය (සියයට 7) සහ හොංකොං (සියයට 6) යන රටවල් ප්‍රධාන විය.

**5.5 රූප සටහන** **වෙළෙඳ දිශාව - 2006**



## 5.4 සේවා වෙළෙඳාම, ආදායම්, සංක්‍රාම සහ ජංගම ගිණුමේ ශේෂය

### ප්‍රවාහන සේවා වෙළෙඳාම

**නැව් කුලී, වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ මගී ගාස්තුවලින් සමන්විත ශුද්ධ ප්‍රවාහන සේවා ඉපැයීම් 2006 වසර තුළදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 211 ක් දක්වා සියයට 3.6 කින් ඉහළ ගියේය.** බහාලුම් ප්‍රතිනැව්ගත කිරීම් ඉහළයාම හේතුවෙන් වරාය ආශ්‍රිත කටයුතු සැළකිය යුතු ලෙස වර්ධනය වීම, ජාතික ගුවන් සේවාවේ ගුවන් ගමනාන්ත පුළුල් කිරීම සහ ගුවන් ගමන් වාර ගණන වැඩි කිරීම මත මගී ගාස්තු ආදායම් ඉහළ යාම, හේතුවෙන් ප්‍රවාහන සේවා ලැබීම් සියයට 11.5 කින් ඉහළ ගියේය. ඉන්දියාවේ ඉහළ ආර්ථික වර්ධනයත් සමඟ පුළුල්වන ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබිඹු කරමින්, බහාලුම් ප්‍රතිනැව්ගත කිරීම් සියයට 37 කින් වර්ධනය විය. රජයේ දස අවුරුදු දැක්ම (2006 - 2016) යටතේ හඳුනාගත් වරාය සංවර්ධන ව්‍යාපෘති කීපයෙන්, විශේෂයෙන්ම කොළඹ දකුණු වරාය ඉදිකිරීම මගින් කොළඹ වරායේ අනාගත ඉපැයීම් හැකියාව සහ තරගකාරීත්වය තවදුරටත් ඉහළ යනු ඇත. මේ අතර ආනයන වර්ධනය මෙන්ම විවේකීව ගතකිරීම, රැකියා, අධ්‍යාපන සහ සෞඛ්‍ය කටයුතු සඳහා විදේශ ගතවන ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් ප්‍රවාහන සේවා ගෙවීම්ද සියයට 14.9 ක ඉහළ අගයකින් වර්ධනය විය.

**5.7 සංඛ්‍යා සටහන** ශුද්ධ සේවා, ආදායම් සහ සංක්‍රාම (අ)

| ශීර්ෂය | එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2005 | එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2006(ආ) | රුපියල් දශ ලක්ෂ 2005 | රුපියල් දශ ලක්ෂ 2006(ආ) |
|---|---|---|---|---|
| 1. ප්‍රවාහනය | 204 | 211 | 20,452 | 21,885 |
| 2. සංචාරක | 115 | 37 | 11,553 | 3,836 |
| 3. විදුලි සංදේශ සේවා | 25 | 19 | 2,503 | 1,959 |
| 4. පරිගණක සහ තොරතුරු සේවා | 82 | 98 | 8,371 | 10,188 |
| 5. ඉදිකිරීම් සේවා | 24 | 24 | 2,396 | 2,456 |
| 6. රක්ෂණ සේවා | 39 | 20 | 3,890 | 2,081 |
| 7. වෙනත් ව්‍යාපාරික සේවා | -134 | -138 | -13,513 | -14,297 |
| 8. රජයේ වියදම් (අන් තැනක සඳහන් නොවන) | -16 | -14 | -1,607 | -1,448 |
| **මුළු සේවා** | **338** | **257** | **34,043** | **26,660** |
| 1. සේවක වන්දි ගෙවීම | -9 | -11 | -940 | -1,138 |
| 2. සෘජු ආයෝජන ආදායම් | -112 | -360 | -11,245 | -37,413 |
| 3. පොලී සහ අනෙකුත් ගෙවීම් | -178 | -18 | -17,864 | -1,802 |
| **මුළු ආදායම** | **-299** | **-388** | **-30,049** | **-40,353** |
| 1. පෞද්ගලික | 1,736 | 2,068 | 174,542 | 215,102 |
| 2. මධ්‍යම ආණ්ඩුව | 93 | 101 | 9,300 | 10,524 |
| **මුළු ජංගම සංක්‍රාම** | **1,828** | **2,169** | **183,842** | **225,626** |

(අ) මෙම ඉදිරිපත් කිරීම ගෙවුම් තුලන අත්පොතෙහි 5 වන සංශෝධනය (1993)ට අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන ආකාරයට සැසඳෙන ලෙස ඉදිරිපත් කර ඇත.


(ආ) තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### විදේශ ගමන් සහ සංචාරක සේවා

**2005 වසරේ දී සනිටුහන් කළ 549,308 ක් වූ සංචාරක පැමිණීම්, 2006 වසරේ දී සියයට 1.9 කින් වර්ධනය වෙමින් 559,603 දක්වා ඉහළ ගියේය.** 2005 වසරේ දී සුනාමි ව්‍යසනය හේතුවෙන් වූ පසුබෑම මග හරවමින්, 2006 වසරේ ප්‍රථම භාගයේ දී, සංචාරක ව්‍යාපාරය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වෙමින්, සියයට 17 කින් වර්ධනය විය. කෙසේ වුවද, වසරේ දෙවන භාගයේදී රටේ ඇති වූ අවිනිශ්චිත ආරක්ෂක තත්ත්වය යටතේ මෙම ප්‍රවනතාවය ක්‍රමයෙන් වෙනස් විය. වසරේ දෙවන භාගයේදී ඉතාලිය, ජර්මනිය, ප්‍රංශය සහ ඕස්ට්‍රේලියාව ඇතුළු බටහිර රටවල් විසින් ශ්‍රී ලංකාව සංචාරය සඳහා අවදානම් රටක් ලෙස ප්‍රකාශ කිරීම, ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීම අධෛර්යමත් කළේය. රජය මෙම තත්ත්වය මගහරවා ශ්‍රී ලංකාව සංචාරය සඳහා ආරක්ෂිත ගමනාන්තයක් ලෙස ප්‍රචලිත කිරීම සඳහා එම රටවල තානාපතිවරුන් සමග සාකච්ඡා කළ අතර, සංචාරක සේවා ප්‍රචලිත කිරීමේ ක්‍රියාදාමයන් ද නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. එසේ තිබියදීත්, 2005 සමග සසඳන විට කාමර උපයෝජනය සහ කාමර සඳහා අය කළ ගාස්තු ඉහළ යාමේ හේතුවෙන් දළ සංචාරක ඉපයුම්, 2006 දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 410.3 දක්වා සියයට 24.7 කින් වැඩි විය. සියයට 40.8 ක වෙළෙඳපොළ කොටසක් සහිතව බටහිර යුරෝපය සංචාරකයින් පැමිණෙන විශාලතම කලාපය ලෙස තවදුරටත් පැවති අතර, සියයට 30.2 ක වෙළෙඳපොළ කොටසක් සහිතව දකුණු ආසියාව සංචාරකයින් පැමිණෙන දෙවන විශාලතම කලාපය වශයෙන් පැවැතුණි. රටක් වශයෙන් ගත් කල, 2005 වසරේ සිට, ඉන්දියාව සංචාරක පැමිණීම්වලට දායක වූ විශාලතම මූලාශ්‍රය විය.

**5.6 රූප සටහන** මාසික සංචාරක පැමිණීම



**5.8 සංඛ්‍යා සටහන** — **සංචාරක ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය**

| ශීර්ෂය | 2002 | 2003 | 2004(අ) | 2005(අ) | 2006(ආ) | වර්ධන වේගය 2005(අ) | වර්ධන වේගය 2006 (ආ) |
|---|---|---|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම් | 393,171 | 500,642 | 566,202 | 549,308 | 559,603 | 13.1 | 1.9 |
| 2. සංචාරක රාත්‍රී ගණන (දහස්) | 3,989 | 5,093 | 5,742 | 4,754 | 5,793 | 12.7 | 21.9 |
| 3. කාමර උපයෝජන අනුපාතය (%) | 43.1 | 53.2 | 59.3 | 45.4 | 47.8 | 11.5 | 5.3 |
| 4. දළ සංචාරක ලැබීම් (රු. දශ ලක්ෂ) | 24,202 | 32,810 | 42,059 | 36,377 | 42,586 | 28.2 | 17.1 |
| 5. ඒක පුද්ගල සංචාරක ලැබීම් | 61,556 | 65,536 | 74,283 | 66,223 | 76,100 | 13.3 | 14.9 |
| 6. මුළු සේවා නියුක්තිය | 93,170 | 112,226 | 129,038 | 125,004 | 133,558 | 15.0 | 6.8 |
| සෘජු | 38,821 | 46,761 | 53,766 | 52,085 | 55,649 | 15.0 | 6.8 |
| වක්‍ර | 54,349 | 65,465 | 75,272 | 72,919 | 77,909 | 15.0 | 6.8 |

(අ) සංශෝධිතයි
(ආ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

### විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ සේවා වෙළෙඳම

**විදුලි සංදේශ සේවා ඉපැයීම් 2006 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 68 දක්වා සියයට 55 කින් ඉහළ ගියේය.** කෙසේ වෙතත්, ජාත්‍යන්තර විදුලි සංදේශ ගිවිසුම 2003 වසරේදී නිදහස් කළ මොහොතේ සිට විදුලි සංදේශ සමාගම් අතරේ ඇති වූ ඉහළ තරඟකාරිත්වය හේතුවෙන් ජාත්‍යන්තර ඇමතුම් ගාස්තු පහළ වැටීම, ශ්‍රී ලංකාවේ සිට ඇරඹෙන ජාත්‍යන්තර ඇමතුම් දිරිමත් කිරීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, විදුලි සංදේශ සේවාවන්හි මූල්‍ය ගෙවීම් 2003 වසරේ සිට නොකඩවා ඉහළ යමින් පවතී. මේ හේතුවෙන්, විදුලි සංදේශ සේවාවන්හි ශුද්ධ ඉපැයීම් 2006 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 19 දක්වා සියයට 24.5 කින් පහළ වැටිණි.

**පරිගණක මෘදුකාංග සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPOs) ඇතුළු තොරතුරු තාක්ෂණ සේවා අපනයනයන්, 2006 වසරේදී අඛණ්ඩව වර්ධනය වීමට තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ යටිතල පහසුකම් වැඩි දියුණුවීම උපකාරි විය.** පරිගණක මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ සේවා අපනයනයන්හි ශුද්ධ ඉපැයීම් 2006 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 98 දක්වා සියයට 19 කින් වර්ධනය විය. ඉහළ සාක්ෂරතාවය හේතුවෙන් මෙම සේවා අපනයනයන් තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට සාපේක්ෂව වාසිසහගත තත්ත්වයක් පවතී. ඉහළ සුදුසුකම්වලින් යුත් ගණකාධිකාරීන්, ඉංජිනේරුවන්, නීතිඥයන්, තොරතුරු තාක්ෂණය පිළිබඳ නිපුණයන් සහ අනෙකුත් වෘත්තිකයන් බිහි කිරීමට ශ්‍රී ලංකාවට හැකියාවක් පවතින අතර සාපේක්ෂ වශයෙන් දියුණු තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වලින් ද සමන්විත වේ. මීට අමතරව, තොරතුරු තාක්ෂණ සංවර්ධනයට සහ විද්‍යුත් වාණිජ කටයුතු (E- Commerce) සඳහා අවශ්‍ය කර්තෘ හිමිකම සහ බුද්ධිමය දේපල අයිතීන් සුරක්ෂිත කළ හැකි යහපත් නීතිමය රාමුවක් ශ්‍රී ලංකාව සතුව පවතී. මෙම ධනාත්මක සාධක ශ්‍රී ලංකාව තුළ තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වාසිදායක අයුරින් යොදා ගැනීමට හැකියාව පවතී.

### ආදයම් ලැබීම් සහ ගෙවීම්

**2006 වසරේදී පුළුල් වෙමින් පැවති ආදායම් ගිණුමේ හිගය සීමා කිරීමට, සැළකිය යුතු ලෙස ඉහළ ගිය නිල සංචිත ආයෝජන ආදායම් උපකාරි විය.** ඉහළ යමින් පවතින ගෝලීය පොලී අනුපාත සහ නිල සංචිත තවදුරටත් ඉහළයෑම හේතුවෙන් 2006 වසරේදී නිල සංචිත ආයෝජනයෙන් ලද පොලී ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 73 ක් දක්වා, සියයට 6 කින් ඉහළ ගියේය. මීට අමතරව, 2006 වසරේදී එ.ජ. ඩොලරය 2005 වසරේදී වාර්තා වූ අධිප්‍රමාණය වීමට එරෙහිව අනෙකුත් ප්‍රධාන මුදල් වර්ග වලට එරෙහිව අවප්‍රමාණය වීම හේතුවෙන්, පවතින වෙළෙඳ වටිනාකම් අනුව තක්සේරු කල විදේශ සංචිත, එ.ජ.ඩොලර් වටිනාකම අනුව දැක්වීමේදී සැළකිය යුතු වාසියක් අත්කර දුනි. මේ අතර, 2005 වසරේදී ණය ගෙවීම් පමා කිරීම අවසන්වීම සහ පෙර ලබාගත් ණය එකතුවීම ඉහළයාම හේතුවෙන් විදේශ ණය මත ගෙවනු ලබන පොලී ගෙවීම්, මෙම වසර තුළදී සැළකිය යුතු අයුරින් ඉහළ ගියේය. පවතින මෙහෙයුම් තවදුරටත් පුළුල් කිරීම සඳහා රඳවාගත් ලාභ නැවත ආයෝජනය කිරීම් ද ඇතුළුව, විදේශ ආයෝජකයන්ගේ ලාභ තම රට වෙත ගෙන යැමද වසර තුළදී සැළකිය යුතු අයුරින් ඉහළ ගියේය.

### ජංගම සංක්‍රාම

**2004 වසරේදී සිදු වූ සුනාමි ව්‍යසනයෙන් පසුව නොකඩවා දෙවන වසරටත් ඉහළ වේගයකින් වර්ධනය වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ හේතුවෙන් ජංගම සංක්‍රාම ගිණුමේ ලැබීම් 2006 වසරේදී සියයට 18.6 කින් ඉහළ ගියේය.** 2006 වසරේදී විදේශ සේවා නියුක්තිය සඳහා පිටව යන්නන්ගේ ගණන 201,143 දක්වා සියයට 14.4 කින් පහත වැටුණ ද, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,326 දක්වා සියයට 21.2 කින් ඉහළ ගියේය. මෙම ඉහළ යැමට මූලිකවම හේතු වූයේ තෙල් නිපදවන මැද පෙරදිග කලාපයේ රටවල සාමාන්‍ය වැටුප් ඉහළයාම, කොරියාව, මැලේසියාව සහ සිංගප්පූරුව වැනි ඉහළ වැටුප් ගෙවන

**විශේෂ සටහන 7**

## විදේශ සේවාහි නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රේෂණ ඉහළ නැංවීම

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රධාන විදේශ විනිමය උපයන මූලාශ්‍රයක් බවට මෑත කාලයේදී පත් වී ඇත. ඛනිජ තෙල් නිපදවන රටවල ඛනිජ තෙල් ආදායම ඉහළයාම සහ සුනාමි ව්‍යසනයෙන් පසුව ඇතිවූ ප්‍රතිඵලයක් ලෙස 2005 සහ 2006 වසර තුළදී ප්‍රේෂණ ඉහළ අගයකින් වර්ධනය විය. ජංගම ගිණුමේ හිඟය සීමාකිරීමට සහ වෙළෙඳ ශේෂයෙන් සියයට 70 ක් පමණ මූල්‍යනය කිරීමට, 2005 සහ 2006 යන වසර වලදී ඉහළ ගිය ප්‍රේෂණ උපකාරී විය. ආර්ථික වැදගත්කම සලකා ( 2005 මහ බැංකු වාර්තාවේ විශේෂ සටහන් අංක 10 බලන්න) විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා 2006 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව මූලිකව නව ක්‍රියාමාර්ග රැසක් අර ගන්නා ලදී.

### විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග

විදේශ සේවා නියුක්තිකයන් මුදල් ප්‍රේෂණය කිරීමේදී සහ ශ්‍රී ලාංකිකයන් සේවය කරන විදේශ රටවලදී ප්‍රේෂණ රැස්කර ගැනීමේදී දේශීය බැංකුවලට මුහුණ පෑමට සිදුවන ගැටළු ආදිය හඳුනාගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව, වාණිජ බැංකු, බලපත්‍රලත් විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතන සංගමය සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශය යන ආයතන සාමුහිකව කටයුතු කර ක්‍රියාමාර්ග රැසක් 2006 වසර තුළදී ආරම්භ කරන ලදී. බොහෝ විදේශ සේවා නියුක්තිකයන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන්නේ වාණිජ බැංකු මගින් සපයන ප්‍රතිලාභ පිලිබඳව දැනුවත් වී නොමැති බවය. මෙලෙස, ශ්‍රමය ලබාගන්නා රටවල වෙසෙන විදේශ සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන්, ශ්‍රී ලංකාවේ වෙසෙන ඔවුන්ගේ යැපෙන්නන් යන දෙආංශයටම සහ විදේශ සේවා නියුක්ත වීමට බලපොරොත්තුවන්නන් හට වාණිජ බැංකු මගින් පිරිනමන ප්‍රතිලාභ පිලිබඳව දැනුවත් කිරීමට, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි විදේශ සේවා නියුක්ත කාර්යාංශය සහ විදේශ සේවා නියෝජ්‍යායතන කටයුතු කරන ලදී. මේ අතර, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වල ආර්ථික වටිනාකම හඳුනාගනිමින් විධිමත් මාර්ගයන් තුලින් මුදල් ප්‍රේෂණය කිරීම සඳහා විදේශ සේවා නියුක්තිකයන් ධෛර්යමත් කිරීම සඳහා අවශ්‍ය පියවර අධ්‍යයනය කිරීමට සහ සුදුසු ප්‍රතිපත්ති යාන්ත්‍රණයක් නිර්දේශ කිරීමට රජය විසින් ඉහළ පෙළේ කමිටුවක් පත්කර ඇත.

මේ සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් ගතයුතු තවත් ක්‍රියාමාර්ග රැසක අවශ්‍යතාවය ප්‍රබලව දැනී ඇත. ඒවා නම්, භාෂා පුහුණුව, ගෘහස්ථ විද්‍යුත් උපකරණ පරිහණය පිළිබඳ පුහුණුව, සේවා නියුක්ත වෙළෙඳපොළවල් විවිධාංගීකරණය කිරීම, දිගුකාලීන සේවක ගිවිසුම් සඳහා අවශ්‍ය කටයුතු කිරීම සහ ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ රැකියාවන් සුරක්ෂිත කිරීමට රජයේ සෘජු මැදිහත්වීම යනාදිය වේ. පෙර දිග ආසියාවේ සහ මැද පෙරදිග ශ්‍රම ලබාගන්නා රටවල් සේවා නියුක්තිකයන්ට කරනු ලබන සාමාන්‍ය වැටුප් ඉහළ නැංවීම සඳහා ධෛර්යමත් කිරීමට උත්සාහ කළ යුතු අතර, එමගින් සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණද ඉහළ යයි. මීට අමතරව, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ තීරු බදු රහිත අලෙවි සැල් තුලින් භාණ්ඩ මිලදී ගැනීමට බදු රහිත දීමනාව යොදාගැනීමේ හැකියාව පිළිබඳ දැනුවත් කිරීමද, තීරු බදු රහිත දීමනාව යොදාගැනීමට හැකි කාලය දීර්ඝ කිරීමද සිදුකළ යුතු බව හැඟී ගොස් ඇත. බදු රහිත දිමනාව, නිවාස ණය සහ විදේශයන්හි සිට මෙරටට පැමිණි පසු ස්වයං රැකියා ආරම්භ කිරීමට දෙනු ලබන වැය පහසුකම් ආදී දිරි ගැන්වීම්, ප්‍රේෂණය කරන ලද මුදලට අනුරූපව සම්බන්ධ කිරීම මඟින්, බැංකු ක්‍රමය තුලින් මුදල් ප්‍රේෂණය කිරීම තවදුරටත් දිරිමත් වේ. මීට සමගාමීව, විදේශ ගතවීමට බලාපොරොත්තු වන පුද්ගලයින් හට පූර්ව පිටවයාමේ ණය පහසුකම් ලබාදීම සහ එම ණය ලබාදුන් බැංකුව මගින්ම මුදල් ප්‍රේෂණය කිරීමට එකඟවීම මගින්ද බැංකු ක්‍රමය තුලින් මුදල් ප්‍රේෂණය කිරීම දිරි ගන්වයි. මේ අතර, රැකියා නියෝජ්‍යායතන දිරිගැන්වීමක් වශයෙන් ඔවුන්ගේ වටිනා දායකත්වය ඇගැයීමට ලක්කළ යුතුය.

වාණිජ බැංකු විසින් ශ්‍රී ලාංකිකයන් සේවයේ යෙදී සිටින රටවල බැංකු කටයුතු කිරීම සඳහා අවශ්‍ය වීසා බලපත්‍ර ලබාගැනීමේදී මුහුණ දෙනු ලබන අපහසුතාවයන් විසඳාගත යුතුය. මෙය ඉතා වැදගත් වන්නේ, නිල මාර්ගයන්ගෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලබාගැනීමට වාණිජ බැංකු විසින් දරනු ලබන උත්සාහය හේතුවෙන් රටට ලැබෙන ප්‍රේෂණ ප්‍රවාහ ඉහළයාම පමණක් නොව, එමගින් ත්‍රස්තවාදී කටයුතු සඳහා මූල්‍ය පහසුකම් සැපයීම ඇතුළු නීත්‍යානුකූල නොවන ක්‍රියාවන් සඳහා මෙම මුදල් යොදවා ගැනීම වැළැක්වීමයි. මෙම ක්‍රියාවලීන් තවදුරටත් දියුණු කිරීම සඳහා, කඩිනමින් ප්‍රේෂණ බාරදීම සඳහා දේශීය බැංකුවලට පුළුල්ව පැතිරී ඇති තැපැල් ජාලය සහ ජංගම දුරකථන තාක්ෂණය භාවිතයට ගතහැකි අතර, තවදුරටත් උසස් සේවාවන් ලබාදීම සඳහා බැංකුවල යටිතල පහසුකම් ප්‍රේෂණ පැවැරුම්ලාභීන් සමග පොදුවේ භාවිතාකළ හැකිය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඔවුන්ගේ වේතන සමග සෘජුව සම්බන්ධ වී ඇති හෙයින්, ශ්‍රී ලංකාවෙන් විදේශ සේවා සඳහා පිටවයන ශ්‍රමිකයන්ගේ නිපුණතා මට්ටමද ක්‍රමයෙන් ඉහළයා යුතුව ඇත.

රටවලට පිටව යන සේවා නියුක්තිකයන්ගේ ගණන ඉහළයාම සහ විද්‍යුත් මුදල් හුවමාරු පද්ධතීන් මෑත කාලයේදී ශ්‍රී ලාංකිකයන් අතර ජනප්‍රිය වීමත්ය. මෑත කාලයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රාජ්‍ය වාණිජ බැංකු, විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ලියාපදිංචි විදේශ රැකියා නියෝජ්‍යායතන සංගමය යන ආයතන හා එකමුතුව ගනු ලැබූ මූලික ක්‍රියා මාර්ග හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අනාගතයේදී තවදුරටත් වැඩිකර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. 2006 වසරේදී වර්ධනය වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, වෙළෙඳ ගිණුමේ හිඟයෙන් සියයට 69 ක් පමණ මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය.

### ජංගම ගිණුමේ ශේෂය

**ජංගම ගිණුමේ හිඟය 2005 වසරේදී වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 651 සිට 2006 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,334 දක්වා සැළකිය යුතු අයුරින් පුළුල් විය.** දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට එය 2005 වසරේදී වාර්තා වූ සියයට 2.8 ක සිට 2006 වසරේදී සියයට 4.9 ක් දක්වා ඉහළ ගියේය. පුළුල් වන ජංගම ගිණුමේ හිඟය රටෙහි ආයෝජන - ඉතිරි කිරීමේ පරතරයෙන් පෙන්නුම් කරන අතර, ආර්ථික වර්ධන වේගය සියයට 7-8 ක මට්ටමක පවත්වාගෙන යාමට අවශ්‍ය අයෝජන වියදම් සඳහා විදේශීය ප්‍රාග්ධනය ආකර්ෂණය කිරීමේ අවශ්‍යතාවයද මෙමගින් පෙන්නුම් කරයි.

## 5.5 ප්‍රාග්ධන සහ මූල්‍ය ප්‍රවාහ සහ ගෙවුම් තුලනය


### විදේශීය ඍජු ආයෝජන

**1997 දී මෙතෙක් වාර්තා වූ ඉහළම විදේශීය ඍජු ආයෝජන ලැබීම් ද අභිබවා යමින්, 2006 වසරේ දී ඉහළම විදේශීය ඍජු ආයෝජන ලැබීම් වාර්තා කිරීමට ශ්‍රී ලංකාව සමත් විය.** පෞද්ගලීකරණ ලැබීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 301 ක් ද ඇතුළුව 1997 දී වාර්තා වූ ඉහළම විදේශීය ඍජු ආයෝජන වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 450 ක් ද අභිබවා යමින් 2006 වසරේ දී, විදේශීය ඍජු ආයෝජන, මෙතෙක් ලැබූ ඉහළම අගය වාර්තා කරමින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 604 ක් දක්වා ළඟා විය. මෙම වාර්තා ගත විදේශීය ඍජු ආයෝජනයන්ට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ආයෝජන මණ්ඩලය යටතේ වූ සේවා අංශයේ ව්‍යාපාර වල ඉපැයීම් නැවත ආයෝජන කිරීම හා ආයෝජන මණ්ඩලය මගින් විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා අනුගමනය කළ අඩු සංවර්ධිත කලාපයන් තුළ පිහිටුවීමට යෝජිත කර්මාන්ත 300 ක නිපැයුම් මධ්‍යස්ථාන වැඩසටහන ද ඇතුළත් නව ක්‍රියාමාර්ගයන්ය. 2006 වසරේ විදේශීය ඍජු ආයෝජනයන් තුළ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 81 ක් වූ හිමිකම් ප්‍රාග්ධනය, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 75 ක් වූ කොටස් හිමියන්ගේ ණය සහ අත්තිකාරම්, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 124 ක් වූ විදේශිය ණය සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 324 ක් වූ දැනට පවතින සමාගම්වල රඳවාගත් ඉපැයීම් නැවත ආයෝජනය කිරීම් ඇතුළත් විය. මාර්ග, මහාමාර්ග, සහ බලශක්ති සැපයුම වැනි මූලික යටිතල පහසුකම් සංවර්ධනය වේගවත් කිරීම, සශ්‍රීක ව්‍යාපාරික පරිසරයක් පවත්වාගැනීම සඳහා අවශ්‍ය වන දේපළ හිමිකම් සුරැකීම, ශීඝ්‍ර සහ කාර්යක්ෂම ලෙස ගැටළු නිරාකරණය සහ ශ්‍රම සංචලනය පහසු කරවීම වැනි අංග විදේශීය ඍජු ආයෝජන ඉහළ දැමීමට ඉදිරියේ දී උපකාරී වනු ඇත. මේ අතර, 2005 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 38 ක විදේශීය ඍජු ආයෝජන ගලායෑම් සමග සසඳා බැලීමේ දී 2006 වසරේ දී, විදේශීය ඍජු ආයෝජන ගලායෑම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 30 ක් දක්වා අඩු වීමට හේතු වූයේ, වසර තුළ දී තෝරාගත් දේශීය සමාගම් කිහිපයක් පමණක් විදේශයන්හි ආයෝජනය කිරීමයි.

### රජයට ලැබුණු ණය ප්‍රාග්ධනය

**2006 වසරේ දී වාර්තාගත එ.ජ.ඩොලර් බිලියන 1.2 වටිනා ණය සහ ප්‍රදාන රැස්කර ගැනීමට රජය සමත් විය.** 2006 වසරේ ලැබුණු මුළු ණය වලින් සියයට 75 ක් සහනදායී කොන්දේසිවලටත් ඉතිරි සියයට 25 වාණිජමය කොන්දේසි වලටත් යටත්ව ලැබුණි. සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා විශාල වශයෙන් ලැබුණු ප්‍රදාන හේතුවෙන් 2005 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 236 හා සසඳන විට, 2006 වසරේ දී ජංගම හා ප්‍රාග්ධන මාදිලියන්ගෙන් සමන්විත මුළු ප්‍රදානයන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 287 ක් දක්වා වැඩි විය. මේ අතර දිගුකාලීන ණය ලැබීම් 2006 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 932 දක්වා ඉහළ ගියේය. 2006 වසරේ දී ඒකාබද්ධ ණය යටතේ ජාත්‍යන්තර වෙළෙඳපොළ හරහා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 150 ක් රැස්කර ගැනීමට රජය සමත් විය. සහනදායී ණය ලැබීම් ද එ.ජ.ඩොලර් දශ ලක්ෂ 703 දක්වා සියයට 11 කින් ඉහළ ගියේය. 2006 දී රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන, ග්‍රාමීය මූල්‍ය අංශ සංවර්ධන වැඩසටහන, සහ සපුගස්කන්ද විදුලි බලාගාර ව්‍යාපෘතිය සඳහා ලැබුණු වැඩසටහන් ණයවලින් සමන්විත මුළු වැඩ සටහන් ණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 52 ක් දක්වා ඉහළ ගියේය. කෙසේ නමුත්, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් වැඩසටහන් ණය ලෙස රජයට ලබාගත හැකිව තිබූ මුළු ණය ප්‍රමාණය 2006 වසරේ දීත් රජයට ප්‍රයෝජනයට ගැනීමට නොහැකි විය. සුනාමි ව්‍යසනය නිසා අලාභහානි වූ යටිතල පහසුකම් නැවත

5.7 රූප සටහන
නිල සහ පෞද්ගලික ප්‍රාග්ධන ලැබීම්



**5.9 සංඛ්‍යා සටහන**

## 2006 වසර තුළ විදේශ ණය දෙන ආයතනවලින් විදේශ ආධාර ලබාදුන් ව්‍යාපෘතීන්

| ආයකයා | ව්‍යාපෘතිය | ලැබුණු ණය මුදල එ.ජ. ඩොලර් දශ ලක්ෂ |
|---|---|---|
| **ආසියානු සංවර්ධන බැංකුව** | | **174.9** |
| එයින් | දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය | 23.4 |
| | ග්‍රාමීය මූල්‍ය අංශ සංවර්ධන වැඩසටහන | 19.7 |
| | මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 19.0 |
| | රාජ්‍ය මූල්‍ය කලමණාකරණ ආයතනය සවි බල ගැන්වීමේ ව්‍යාපෘතිය | 15.5 |
| | මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 13.7 |
| **ජාත්‍යන්තර සංවර්ධන ආයතනය** | | **100.2** |
| එයින් | සුනාමි හානි ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය අදියර II | 24.6 |
| | ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සහා ප්‍රතිවර්ධන බලශක්ති ව්‍යාපෘතිය | 19.3 |
| | උතුරු නැගෙනහිර නිවාස නැවත ගොඩනැගීමේ ව්‍යාපෘතිය | 16.3 |
| | මාර්ග අංශ  සහයෝගීතා ව්‍යාපෘතිය | 13.6 |
| **ජපානය** | | **262.5** |
| එයින් | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය | 44.7 |
| | ශ්‍රී ලංකා සුනාමි හානි ප්‍රදේශ පුනුරුත්තාපන සහ නගා සිටුවීමේ ව්‍යාපෘතිය (STAART) | 27.3 |
| | දක්ෂිණ අධිවේගී මාර්ගය ගොඩනැගීමේ ව්‍යාපෘතිය | 25.8 |
| | කුඩා සහ ක්ෂුද්‍ර කර්මාන්ත නායකත්වය සහ ව්‍යවසායකත්ව පුහුණු ව්‍යාපෘතිය අදියර III (SMILE III) | 24.7 |
| | සුළු පරිමාණ යටිතල පහසුකම් පුනරුත්තාපන සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 22.9 |
| | මහකොළඹ සඳහා කළු ගඟ ජල සැපයුම් ව්‍යාපෘතිය | 16.9 |
| | මහනුවර ජල සැපයුම් ව්‍යාපෘතිය | 15.9 |
| | සුළු පරිමාණ යටිතල පහසුකම් පුනරුත්තාපන පහසුකම් සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (SIRVP II) | 15.7 |
| **ජර්මානු සමූහාණ්ඩුව** | | **55.2** |
| එයින් | පෞද්ගලික අංශ සංවර්ධන වැඩසටහන - සංවර්ධන මූල්‍ය සමායතනය (DFCC) අදියර IV | 17.9 |
| | සපුගස්කන්ද ඩීසල් විදුලි බලාගාර ව්‍යාපෘතිය පළමු අදියර | 16.4 |
| | පෞද්ගලික අංශ සංවර්ධන වැඩසටහන - ජාතික සංවර්ධන බැංකුව (NDB) අදියර V | 10.1 |
| **සිටිකෝප් ආයෝජන බැංකු ආයතනය** | | **100.0** |
| | ඒකාබද්ධ ණය | 100.0 |
| **හොංකොං සහ ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්** | | **50.0** |
| | ඒකාබද්ධ ණය | 50.0 |

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ප්‍රතිසංස්කරණය කිරීම සහ අනිකුත් යටිතල පහසුකම් සැපයීම හේතුවෙන් ව්‍යාපෘති ණය 2006 වසරේ දී සියයට 6.5 කින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 651 දක්වා ඉහළ ගියේය. ණය උපයෝජන අනුපාතය[1] 2005 වසරේ දී වාර්තා වූ සියයට 17.0 සිට 2006 වසරේ දී සියයට 21.2 දක්වා ඉහළ  ගියේය. 2005 වසරේ දී ක්‍රියාත්මක වූ ණය නැවත ගෙවීම පමාකිරීමේ පහසුකම අවසන්ව, 2006 වසරේ දී නැවත ණය සේවාකරණය ඇරඹීමත්, ආරක්ෂක ණය සේවාකරණය ඉහළ යාමත් හේතුවෙන්  2006 වසරේ දී ණය සේවාකරණ වියදම් සියයට 127.4 කින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 441 ක් දක්වා ඉහළ ගියේය.

**දේශීය සහ විදේශීය සහනදායී නොවන, විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම්ද 2006 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** මෙම විදේශ ව්‍යවහාර මුදල් වාණිජ ණය ගැනීම්, රුපියල් ණයවලට වඩා සහනදායී වුවත්, මෙම වාණිජ ණය. ප්‍රමාණය ප්‍රමාණාත්මකව ඉහළ යෑම නිසා ඒ මත විදේශ විනිමය අනුපාතය වෙනස් වීම හේතුවෙන් ඇතිවන බලපෑමේ අවදානමද වැඩිවේ. සහනදායී විදේශ ණය සමග සැසඳීමේ දී මෙවන් ණය, අඩු පරිණත කාලයකින් සහ ඉහළ පොලී අනුපාතිකයන්ගෙන් යුක්ත වන නිසා, විදේශ ව්‍යවහාර මුදල් වාණිජ ණය ඉහළ ඵලදායීතාවයකින් යුත් ව්‍යාපෘතිවල යෙදවීමෙන් මෙවන් ණය තුළින් ඇතිවන රාජ්‍ය මූල්‍ය සහ ණය දරාගැනීමේ හැකියාවට සිදුවන අවදානම් අඩුකර ගත හැක. මේ අනුව, විකල්ප මූල්‍ය පහසුකම් සපයාගැනීමේ මාර්ග යක් ලෙස, රාජ්‍ය-පුද්ගලික සහයෝගිතාවයන් (Public-Private Partnerships), අත්‍යවශ්‍ය ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරීව යොදවා ගැනීමට රජය සැලකිලිමත් විය යුතුය. සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් දිගුකාලීන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සපයන මාර්ගයක් ලෙසත්, දිගුකාලීන ව්‍යාපෘතිවල අවදානම අඩු කිරීමේ ක්‍රමයක් ලෙසත්, පෞද්ගලික අංශයේ කළමනාකරණ කාර්යක්ෂමතාව සහ හැකියාව උකහා ගැනීම සඳහාත් රාජ්‍ය-පුද්ගලික සහයෝගිතාවයන්

[1] ණය උපයෝජන අනුපාතය ගණනය කර ඇත්තේ ජුනි මස අවසානය වන විට එකග වී ඇති එහෙත් මුදානොහරින ලද විදේශාධාරවල වටිනාකමෙන්, වසර තුළ මුදා හරින ලද විදේශාධාරවල වටිනාකම ප්‍රතිශතයක් ලෙස ගැනීමෙනි.

බහුලව යොදාගැනේ. එසේම, ද්විපාර්ශ්වික ණය දෙන ආයතන හරහා ලබාගන්නා ණයවලට අදාළ අපනයන ණය පහසුකම් වල සැඟවුණු පිරිවැය හේතුවෙන් බොහෝ අවස්ථාවල එම ණය පහසුකම්වල සත්‍ය පිරිවැය, සහනදායී පොලී අනුපාතිකයන්වලට වඩා ඉහළ අගයක් ගැනීම පිළිබඳ සැලකිලිමත් වීම වැදගත් වේ. මෙවැනි පහසුකම් යටතේ ණය මුදලින් විශාල ප්‍රතිශතයක් නම් කරන ලද ආයතනවලින් හෝ ණය දෙන රටවල් හරහා භාණ්ඩ සහ සේවා සපයාගැනීමට යොදවා ගැනීම හේතුවෙන් බොහෝ අවස්ථාවල ණය ලබාගන්නා රටවල්වලට තරඟකාරී ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීම් හරහා ලබාගත හැකි ප්‍රතිලාභ අහිමි වේ. බොහෝ අවස්ථාවන්හිදී මෙවැනි පහසුකම් තුළ අනවශ්‍ය තාක්ෂණික සහාය වැඩසටහන්, රක්ෂණ වාරික, කළමනාකරණ හා අනෙකුත් ගාස්තු ලෙස සැඟවුණු පිරිවැය අන්තර්ගත වෙයි.

### පෞද්ගලික අංශයට ලැබුණු ප්‍රාග්ධනය

පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථාවලට ලැබුණු දිගුකාලීන ප්‍රාග්ධන ලැබීම් 2006 වසරේ දී පහත වැටුණි. 2006 වසරේ ප්‍රථම භාගයේ දී පෞද්ගලික අංශයේ විදේශීය ණය ලබාගැනීම අධෛර්යමත් වීමට අඩු පොලී අනුපාතයන් යටතේ දේශීය වෙළෙඳපොළෙන් ණය ලබාගැනීමට ඇති හැකියාව සහ විදේශ ණයවල පොලී අනුපාතයන් ඉහළ යාම හේතු වුණි. පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථා ණය ලබාගැනීමේ දී අවශ්‍ය වන රාජ්‍ය ඇප නිකුතුවේ දී රජය වැළකී සිටීම ද යම්තාක් දුරට ණය ලැබීම් අඩුවීමට හේතු වුණි. දිගු හා මධ්‍ය කාලීන විදේශ ණය සඳහා පවතින ඉල්ලුම අඩුවීමට තවදුරටත් බලපානු ලැබුවේ පවතින ආරක්ෂක ප්‍රවණතාවයන් පෙරදැරිකොට ගත්, පෞද්ගලික අංශයේ ආයෝජකයින් ආයෝජනය කිරීමට බලාසිටීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමයි. බොහෝ ආයෝජකයින්ගේ හැඟීම පරිදි පවත්නා ආරක්ෂක ප්‍රවණතාවයන් මත රටේ බොහෝ වත්කම් වර්තමානයේ වට්ටම් මිලකට මිල තීරණය වී ඇති අතර, ශීඝ්‍ර යටිතල පහසුකම් සංවර්ධනය සහ පවත්නා වත්කම් නවීකරණය කිරීම හරහා මෙම සියළු වත්කම් නුදුරු අනාගතයේ දී ඉහළ මිලක් ලබාගනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම පසුබිම යටතේ, බොහෝ ආයෝජකයින්ගේ විශ්වාසයට අනුව, වර්තමාන තත්ත්වය ප්‍රයෝජනයට ගෙන තම ආයෝජන වර්තමානයේ දී පුළුල් කිරීම තුළින් අනාගතයේ දී වැඩි ප්‍රතිලාභ ප්‍රමාණයක් ජනනය කිරීමට හැකියාව පවතී.

### කෙටිකාලීන ප්‍රාග්ධන ලැබීම් සහ ගෙවීම්

වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල ආයෝජනය කිරීම් සහ විදේශ ව්‍යවහාර මුදල් දේශීය ණය දීම් හේතුවෙන් 2005 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 176 හා සංසන්දනය කිරීමේ දී මුළු ශුද්ධ කෙටිකාලීන ප්‍රාග්ධන ලැබීම් 2006 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 610 ක ඉහළ අගයක් දක්වා ළඟා විය. කොටස් වෙළෙඳපොළ හරහා සිදුවන විවිධ ආයෝජන ලැබීම් සහ ගෙවීම් යන දෙඅංශයම ඉහළ යාම හේතුවෙන් 2006 වසරේ දී ශුද්ධ කොටස් වෙළෙඳපොළ ප්‍රාග්ධන ලැබීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 51 ක අඩු අගයක් වාර්තා විය. කොළඹ කොටස් වෙළෙඳපොළ ආසියාවේ ඉතාමත් හොඳින් ක්‍රියාත්මක වූ කොටස් වෙළෙඳපොළවල් වලින් එකක් බවට පත්වෙමින් 2005 වසරේ දී වූ දළ ප්‍රාග්ධන ලැබීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 276 හා සැසඳීමේදී 2006 වසරේ දී දළ ප්‍රාග්ධන ලැබීම් ලෙස එ.ජ.ඩොලර් දශ ලක්ෂ 355 ක් ආකර්ශණය කිරීමට සමත් විය. විදේශ ව්‍යවහාර මුදල් මගින් රජයට ණයදීම් සහ වාණිජ බැංකුවල විදේශ ණය ගැනීම් තුළින් විදේශ ව්‍යවහාර මුදල් වගකීම්වල ඉහළයාමේ සමස්ත ප්‍රතිඵලයක් ලෙස වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස 2006 වසරේ දී පහළ ගියේය.

### ගෙවුම් තුලනය සහ විදේශ වත්කම්


**ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ ශුද්ධ ලැබීම්, පුළුල් වූ ජංගම ගිණුමේ හිඟය පියවීමටත් වඩා ප්‍රමාණවත් වූ හෙයින්, 2006 වසරේ දී සමස්ත ගෙවුම් තුලන අතිරික්තය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 204 ක් දක්වා වර්ධනය විය.**

### විදේශ වත්කම්

අඛණ්ඩව දෙවන වසරටත් වාර්තා වූ ගෙවුම් තුලනයේ අතිරික්තය, දළ නිල විදේශ වත්කම් ප්‍රමාණය වර්ධනය කිරීමට හේතු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය පියවීම මධ්‍යයේ වුවද, ආසියානු නිශ්කාෂණ සංගමයේ ලැබීම් ඇතුළත් නොවූ දළ නිල විදේශ වත්කම් ප්‍රමාණය, තවදුරටත් වර්ධනය විය. කෙසේ වෙතත් 2006 වසරේ දී ඛනිජ තෙල් ආනයන වියදම් ඉහළයාම හේතුවෙන්, 2005 වසරේ දී ආනයනික මාස 3.3 කට ප්‍රමාණවත් වූ දළ නිල සංචිත 2006 වසරේ දී ප්‍රමාණවත් වූයේ ආනයනික මාස 3 කට පමණි. මේ අතර, විදේශ වත්කම්වල ප්‍රමාණාත්මකභාවය, දළ නිල විදේශ වත්කම් කෙටිකාලීන ණය සහ වගකීම්වල ප්‍රතිශතයක් ලෙස බැලූ විට, 2005 වසරේ සියයට 84 ක ප්‍රමාණයේ සිට 2006 වසරේ දී එය සියයට 92 ක් දක්වා වර්ධනය විය. මෙවැනි ප්‍රගතියක්

5.8 රූප සටහන

ත්‍රෛමාසික විදේශ සංචිත



5.10 සංඛ්‍යා සටහන

**ශ්‍රී ලංකාවේ විදේශ වත්කම් (අ)**

| | එ.ජ. ඩොලර් දශ ලක්ෂ (ආ) | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2002 | 2003 | 2004 | 2005 | 2006 |
| 1. රජය | 46 | 55 | 95 | 131 | 128 | 4,424 | 5,320 | 9,897 | 13,417 | 13,789 |
| 2. රාජ්‍ය නියෝජ්‍යකත්වය | - | - | - | - | - | - | - | - | - | - |
| 3. මහ බැංකුව | 1,654 | 2,274 | 2,101 | 2,604 | 2,709 | 160,018 | 219,984 | 219,795 | 265,873 | 291,747 |
| 4. මුළු නිල වත්කම් | 1,700 | 2,329 | 2,196 | 2,735 | 2,837 | 164,442 | 225,304 | 229,693 | 279,290 | 305,536 |
| 5. වාණිජ බැංකු | 795 | 889 | 1,243 | 1,466 | 1,169 | 76,921 | 86,011 | 129,987 | 149,656 | 125,867 |
| 6. මුළු විදේශීය වත්කම් | 2,495 | 3,218 | 3,438 | 4,201 | 4,005 | 241,364 | 311,315 | 359,680 | 428,946 | 431,403 |
| 7. දළ නිල වත්කම් මගින් කළ හැකි ආනයන මාස ගණන | | | | | | | | | | |
| 7.1 වෙළෙඳ භාණ්ඩ | 3.3 | 4.2 | 3.3 | 3.7 | 3.3 | | | | | |
| 7.2 භාණ්ඩ හා සේවා | 2.9 | 3.6 | 2.9 | 3.3 | 2.9 | | | | | |
| 8. මුළු වත්කම් මගින් කළහැකි ආනයන මාස ගණන | | | | | | | | | | |
| 8.1 වෙළෙඳ භාණ්ඩ | 4.9 | 5.8 | 5.2 | 5.7 | 4.7 | | | | | |
| 8.2 භාණ්ඩ හා සේවා | 4.2 | 5.0 | 4.5 | 5.0 | 4.1 | | | | | |

(අ) 2002 වසරේ සිට සංචිත ගණනය කර ඇත්තේ වෙළෙඳපොළ වටිනාකම අනුව ගැලපීමේ පදනම මතය.

(ආ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟ වන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්තනය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සඳහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයින්ට අනුව පරිවර්තනය කර ඇත.

| වසර අවසානයේ දී | 2002 | 2003 | 2004 | 2005 | 2006 |
|---|---|---|---|---|---|
| එ.ජ. ඩොලර් එකකට රුපියල් | 96.73 | 96.74 | 104.61 | 102.12 | 107.71 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

තිබිදීත්, ආනයන වියදම් මූල්‍යනය කිරීම සඳහා ඇති වූ අතිරික්ත ඉල්ලුම සපුරාලීම සඳහා වාණිජ බැංකු වල විදේශ වත්කම් යොදා ගැනීම හේතුවෙන්, ආසියානු නිශ්කාෂණ සංගමයේ ලැබීම් ඇතුළත් නොවූ රටෙහි මුළු සංචිත ප්‍රමාණය පහත වැටුණි.

## 5.6 විදේශ ණය සහ ණය සේවාකරණය


### විදේශ ණය

**දළ දේශීය නිෂ්පාදිතයේ ශීඝ්‍ර ඉහළයාම හේතුවෙන්, 2006 වසරේ දී මුළු විදේශීය ණය ප්‍රමාණය, රටෙහි ණය දරාගැනීමේ හැකියාවේ වර්ධනය පිළිබිඹු කරමින්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස තවදුරටත් පහත වැටිණි.** මේ අනුව, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස, මුළු විදේශ ණය ප්‍රමාණය, 2005 වසරේ දී වූ සියයට 48.2 සිට 2006 වසරේ දී සියයට 45.4 දක්වා අඩු විය. රජයට ලැබුණු විදේශ ණය ඉහළ යාමත් එ.ජ.ඩොලරය අනෙකුත් ප්‍රධාන මුදල් ඒකකයන්ට එරෙහිව අවප්‍රමාණය වීමත් හේතුවෙන් එ.ජ.ඩොලර් වටිනාකම අනුව 2006 වසරේ දී මුළු විදේශ ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 12,235 දක්වා සියයට 7.8 කින් ඉහළ ගියේය. මුළු විදේශ ණය ප්‍රමාණයෙන් සියයට 42 ක් පමණ වි.ගැ.හි. වලින් ද, සියයට 30 ක් පමණ ජපන් යෙන් වලින් ද සමන්විත වේ. මේ අතර, ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම් සහ වාණිජ බැංකු වගකීම් ඇතුළත් මුළු විදේශ ණය සහ වගකීම්, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 52.8 ක් දක්වා අඩු වුණි. 2006 වසරේ දී වාණිජ බැංකුවල විදේශ ණය ගැනීම් හේතුවෙන් බැංකු අංශයේ විදේශ වගකීම් සියයට 20 කින් එ.ජ.ඩොලර් දශලක්ෂ 1,994 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**මැදි හා දිගුකාලීන මුළු ණයවලින් සියයට 90 ක් ම රාජ්‍ය අංශයේ ණය වන අතර, ඉතිරි සියයට 10 පෞද්ගලික අංශය, රාජ්‍ය සංස්ථා සහ ජා.මු.අරමුදලෙන් ලබාගත් ණයවලින් සමන්විත වේ.** මේ තුළින් රාජ්‍ය අංශයේ විදේශ ණය ලබාගැනීමේ පරිණතභාවය පිළිබිඹු වන අතර පෞද්ගලික අංශයට විදේශ ණය ආකර්ෂණය කර ගැනීමේ දී මතුවන සීමාවන්ද පිළිබිඹු වේ. මූල්‍යමය වශයෙන් ස්ථාවර පෞද්ගලික අංශයේ ආයතන තම ආයෝජන අවශ්‍යතාවයන් සඳහා මැදි හා දිගුකාලීන විදේශ ණය ලබා ගැනීම සඳහා උනන්දු කළයුතුය. මේ මගින් විදේශ මාර්ගවලින් ණය මුදල් ලබාගත නොහැකි පෞද්ගලික අංශයේ ආයතනවලට දේශීය මූල්‍ය වත්කම් භාවිතා කිරීමට ඉඩ සැලසේ. රජයේ මුළු විදේශ ණය තොග යෙන් සියයට 96 ක්ම සහනදායී විදේශ ණය වේ.

5.9 රූප සටහන

**විදේශ ණය**



**5.11 සංඛ්‍යා සටහන**

**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම්**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2002 | 2003 | 2004 | 2005 | 2006(අ) | 2002 | 2003 | 2004 | 2005 | 2006(අ) |
| **1. මැදි හා දිගු කාලීන ණය** | **8,732** | **10,116** | **10,699** | **10,690** | **11,601** | **844,709** | **978,556** | **1,119,155** | **1,091,644** | **1,249,518** |
| 1.1 රජය | 7,464 | 8,812 | 9,523 | 9,354 | 10,502 | 721,956 | 852,433 | 990,203 | 955,207 | 1,131,074 |
| 1.2 රජය විසින් සහතික කරන ලද රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය | 689 | 602 | 507 | 567 | 461 | 66,663 | 58,251 | 52,986 | 57,912 | 49,662 |
| 1.3 රජය විසින් සහතික නොකරන ලද රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය | 293 | 334 | 411 | 388 | 394 | 28,303 | 32,319 | 42,944 | 39,588 | 42,465 |
| 1.4 ජා.මූ.අත් කළ ගැණුම් | 287 | 368 | 258 | 381 | 244 | 27,787 | 35,552 | 27,023 | 38,937 | 26,316 |
| **2. කෙටි කාලීන ණය** | **601** | **620** | **647** | **664** | **634** | **58,116** | **59,935** | **67,726** | **67,759** | **68,286** |
| 2.1 රජය | - | - | - | - | - | - | - | - | - | - |
| 2.2 අනෙකුත් (ආ) | 601 | 620 | 647 | 664 | 634 | 58,116 | 59,935 | 67,726 | 67,759 | 68,286 |
| **3. බැංකු අංශය විදේශ වගකීම් (ඇ)** | **1,001** | **1,046** | **1,429** | **1,666** | **1,994** | **96,807** | **101,149** | **149,492** | **170,170** | **214,802** |
| 3.1 මහ බැංකුව | 1 | - | 1 | 1 | 3 | 123 | 32 | 128 | 131 | 284 |
| 3.2 වාණිජ බැංකු | 865 | 863 | 1,066 | 1,388 | 1,681 | 83,655 | 83,514 | 111,464 | 141,753 | 181,040 |
| 3.3 ආසියානු නිශ්කාශන සංගමයේ වගකීම් | 135 | 182 | 362 | 277 | 311 | 13,029 | 17,604 | 37,899 | 28,286 | 33,478 |
| **4. මුළු විදේශීය ණය** | **9,333** | **10,735** | **11,346** | **11,354** | **12,235** | **902,825** | **1,038,491** | **1,186,881** | **1,159,403** | **1,317,794** |
| **5. මුළු විදේශීය ණය සහ වගකීම්** | **10,334** | **11,781** | **12,775** | **13,020** | **14,230** | **999,632** | **1,139,640** | **1,336,373** | **1,329,573** | **1,532,605** |
| **විශේෂිත අයිතමයන්** | | | | | | | | | | |
| මැදි හා දිගු කාලීන ණය | | | | | | | | | | |
| (1) ව්‍යාපෘති ණය | 4,358 | 6,961 | 7,702 | 7,416 | 8,071 | 421,637 | 673,432 | 805,646 | 757,262 | 869,336 |
| (2) ව්‍යාපෘති නොවන ණය | 3,048 | 1,726 | 1,763 | 1,655 | 1,855 | 294,880 | 167,007 | 184,467 | 169,038 | 199,770 |
| (3) සැපයුම්කරුවන්ගේ ණය | 100 | 218 | 240 | 283 | 459 | 9,718 | 21,048 | 25,123 | 28,907 | 49,458 |
| (4) ජා.මූ. අත් කළ ණය | 287 | 368 | 258 | 381 | 244 | 27,787 | 35,552 | 27,023 | 38,937 | 26,316 |
| (5) අනෙකුත් ණය (ඈ) | 939 | 843 | 735 | 955 | 972 | 90,686 | 81,516 | 76,896 | 97,500 | 104,638 |
| **කෙටිකාලීන ණය හා බැංකු අංශයේ වගකීම්** | **1,602** | **1,665** | **2,077** | **2,330** | **2,628** | **154,923** | **161,084** | **217,217** | **237,929** | **283,088** |
| **ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන්** | | | | | | | | | | |
| මුළු විදේශ ණය | 56.3 | 58.9 | 56.6 | 48.2 | 45.4 | 57.0 | 59.0 | 58.5 | 49.0 | 47.0 |
| බැංකු අංශයේ මුළු විදේශීය වගකීම් | 6.0 | 5.7 | 7.1 | 7.1 | 7.4 | 6.1 | 5.7 | 7.4 | 7.2 | 7.7 |
| මුළු විදේශීය ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම් | 62.4 | 64.6 | 63.7 | 55.3 | 52.8 | 63.1 | 64.7 | 65.9 | 56.2 | 54.7 |
| කෙටිකාලීන ණය | 3.6 | 3.4 | 3.2 | 2.8 | 2.4 | 3.7 | 3.4 | 3.3 | 2.9 | 2.4 |
| කෙටිකාලීන ණය හා බැංකු අංශයේ විදේශ වගකීම් | 9.7 | 9.1 | 10.4 | 9.9 | 9.7 | 9.8 | 9.2 | 10.7 | 10.1 | 10.1 |
| **මුළු ණයවල ප්‍රතිශතයත් වශයෙන්** | | | | | | | | | | |
| කෙටිකාලීන ණය | 5.8 | 5.3 | 5.1 | 5.1 | 4.5 | 5.8 | 5.3 | 5.1 | 5.1 | 4.5 |
| කෙටිකාලීන වගකීම් | 9.7 | 8.9 | 11.2 | 12.8 | 14.0 | 9.7 | 8.9 | 11.2 | 12.8 | 14.0 |
| කෙටිකාලීන ණය, නිල විදේශීය සංචිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් | 35.3 | 26.6 | 29.5 | 24.3 | 22.4 | 35.3 | 26.6 | 29.5 | 24.3 | 24.4 |

(අ) තාවකාලික
(ආ) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය සහ වෙළෙඳ ණය ඇතුළත් කොට ඇත.
(ඇ) ආසියානු නිෂ්කාශන සංගමයේ ණය සහ වි.ව්‍ය.මු.බැ.ඒ. ඇතුළත් වාණිජ බැංකුවල විදේශ වගකීම් ද ඇතුළත් වේ.
(ඈ) රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගුකාලීන ණය.

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

## විදේශ ණය සේවාකරණ ගෙවීම්

**2005 වසරේ දී ණය ගෙවීම් ප්‍රමාද කිරීමේ ප්‍රතිලාභ හේතුවෙන්, එම වසරේ දී පමණක් අඩු වූ ණය සේවාකරණ අනුපාතය, 2006 වසරේ දී නැවතත් සුනාමි ව්‍යසනයට පෙර පැවැති මට්ටම කරා ළඟා විය.** ණය වාරික සහ පොලී වලින් සමන්විත මුළු ණය ගෙවීම් 2006 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,079 දක්වා සියයට 73.2 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. පැරිස් කණ්ඩායමේ සාමාජික රටවලින්, ජී-8 කණ්ඩායමේ සහ බහුපාර්ශ්වීය ණය ලබාදෙන ආයතන මගින් 2005 වසරේ දී ලබාදුන් ණය ගෙවීම් පමාකිරීමේ පහසුකම අවසන් වීමත් සමඟම සැලසුම්ගත ණය සේවාකරණ ගෙවීම් 2006 වසරේ දී නැවත ඇරඹීම, ආරක්ෂක ණය ආපසු ගෙවීම් ඉහළ යාම, රජයේ වාණිජමය ණයවල සේවාකරණ වියදම් ඉහළ යාම, සහ එ.ජ.ඩොලරය වි.ගැ.හි. වලට එරෙහිව අවප්‍රමාණය වීම, 2006 වසරේ දී මුළු ණය සේවාකරණ ගෙවීම් එ.ජ.ඩොලර් වටිනාකමට අනුව සැලකිය යුතු ලෙස ඉහළයාමට හේතු විය. ඉහළ විදේශ ණය තොගයක් හමුවේ වුවත්, රටක විදේශ ණය සේවාකරණ හැකියාව මනින මිනුම් දණ්ඩක් වන ණය සේවාකරණ අනුපාතය තවමත් සතුටුදායක මට්ටමක පවතින්නේ ශ්‍රී ලංකාවේ විදේශ ණය තොගය තුළ ඉතා ඉහළ සහනදායී සහ දිගු පරිණත කාලයකින් සමන්විත විශාල ණය ප්‍රමාණයක් පැවතීම හේතුවෙනි.

**5.12 සංඛ්‍යා සටහන**

**ණය සේවා ගෙවීම්**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2002 | 2003 | 2004 | 2005 | 2006(අ) | 2002 | 2003 | 2004 | 2005 | 2006(අ) |
| 1. ණය සේවා ගෙවීම් | 788 | 761 | 843 | 623 | 1,079 | 74,704 | 73,125 | 85,318 | 62,577 | 112,599 |
| 1.1 ණය ආපසු ගෙවීම් | 572 | 526 | 594 | 419 | 759 | 54,006 | 50,502 | 59,990 | 42,075 | 79,227 |
| (i) ජා. මූ. අරමුදලට | 56 | 32 | 107 | 39 | 144 | 4,647 | 2,869 | 10,718 | 3,902 | 15,276 |
| (ii) අනෙකුත් | 516 | 493 | 487 | 380 | 615 | 49,359 | 47,632 | 49,272 | 38,173 | 63,951 |
| 1.2 පොලී ගෙවීම් | 216 | 235 | 249 | 204 | 321 | 20,698 | 22,623 | 25,328 | 20,502 | 33,372 |
| (i) ජා. මූ. අරමුදලට | 4 | 4 | 10 | 10 | 14 | 398 | 414 | 988 | 973 | 1,452 |
| (ii) අනෙකුත් | 212 | 230 | 240 | 194 | 307 | 20,300 | 22,209 | 24,340 | 19,530 | 31,920 |
| 2. වෙළඳ භාණ්ඩ අපනයනය හා සේවාවන්ගේ ඉපයීම් | 5,967 | 6,544 | 7,284 | 7,887 | 8,508 | 571,195 | 631,549 | 738,714 | 793,153 | 885,380 |
| 3. වෙළඳ භාණ්ඩ අපනයන සේවා, ආදායම් හා පෞද්ගලික සංක්‍රාම | 7,330 | 8,127 | 9,004 | 9,891 | 11,144 | 701,579 | 784,408 | 912,817 | 994,751 | 1,159,756 |
| 4. ණය සේවා අනුපාතිකය (ආ) | | | | | | | | | | |
| 4.1 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 13.2 | 11.6 | 11.6 | 7.9 | 12.7 | 13.1 | 11.6 | 11.5 | 7.9 | 12.7 |
| ජා. මූ. අරමුදලේ ගනුදෙනු හැර | 12.2 | 11.1 | 10.0 | 7.3 | 10.8 | 12.2 | 11.1 | 10.0 | 7.3 | 10.8 |
| 4.2 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 10.8 | 9.4 | 9.4 | 6.3 | 9.7 | 10.6 | 9.3 | 9.3 | 6.3 | 9.7 |
| ජා. මූ. අරමුදලේ ගනුදෙනු හැර | 9.9 | 8.9 | 8.1 | 5.8 | 8.3 | 9.9 | 8.9 | 8.1 | 5.8 | 8.3 |
| 5. රජයේ ණය සේවා ගෙවීම් | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවා ගෙවීම් (ඇ) | 522 | 502 | 484 | 268 | 610 | 49,928 | 48,452 | 48,952 | 26,927 | 63,369 |
| 5.2 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 66.2 | 66.0 | 57.4 | 43.0 | 56.5 | 66.8 | 66.3 | 57.4 | 43.0 | 56.3 |

(අ) තාවකාලික

(ආ) වසර තුළ විනිමය අනුපාතිකයෙහි සිදු වූ වෙනස්වීම් හේතුවෙන් රුපියල් වටිනාකම හා එ. ජ. ඩොලර් වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගත් කල ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.

(ඇ) ජා.මූ.අරමුදලෙහි ගණුදෙනු හැර

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 5.7 විනිමය අනුපාත ක්‍රම සහ විනිමය අනුපාතයෙහි වෙනස්වීම්

නිදහසේ පාවීමට ඉඩ හරින ලද විනිමය අනුපාත ක්‍රමය 2006 වසර තුළදී ද නොකඩවා ක්‍රියාත්මක වූ අතර, වෙළෙඳපොළ බලපෑම් මත විනිමය අනුපාතය තීරණය වීමට ඉඩ සලසමින්, විනිමය අනුපාතයේ පැවැති අනවශ්‍ය උච්චාවචනයන් අවම කිරීම සඳහා සීමාසහිත ලෙස මැදිහත් විය. 2001 වසරේ මෙම ක්‍රමය හඳුන්වාදීමේ සිට මේ දක්වා ශ්‍රී ලංකාව තුළ එය ඉතා හොඳින් ක්‍රියාත්මක වේ. 2005 වසර තුළ දී ජාත්‍යන්තර ණය දෙන ආයතන විශාල ලෙස සුනාමි ව්‍යසනය හා සම්බන්ධ විදේශ ණය ආධාර ලබාදීම සහ ලබාදීමට එකඟ වීම නිසා, විනිමය අනුපාතය ප්‍රධාන මුදල්වලට එරෙහිව අධිප්‍රමාණය වූ අතර, 2006 වසර තුළ දී එය සාමාන්‍ය තත්ත්වයට පත්වෙමින් අවප්‍රමාණය විය. ප්‍රධාන වශයෙන් 2006 වසර තුළ දී ප්‍රධාන මුදල් වලට එරෙහිව එ.ජ.ඩොලරය දුර්වලවීම නිසා ශ්‍රී ලංකා රුපියල එ.ජ.ඩොලරයට (සියයට 5.2), ජපානයෙන් (සියයට 4.3) සහ ඉන්දියානු රුපියල් (සියයට 7.2) වලට එරෙහිව මඳ වශයෙන් අවප්‍රමාණය වූ අතර බ්‍රිතාන්‍ය පවුමට (සියයට 16.7) සහ යූරෝවලට (සියයට 14.6) එරෙහිව ඉහළ අනුපාතයකින් අවප්‍රමාණය විය.

ශ්‍රී ලංකාවේ වෙළෙඳ හවුල්කාර රටවල් සහ තරගකාරී රටවල් සමග සසඳන කල සාපේක්ෂව පැවැති ඉහළ උද්ධමනය සහ ආනයන වියදම් විශාල ලෙස ඉහළයාම නිසා ජංගම ගිණුමේ ඇති වූ විශාල හිඟය, විනිමය අනුපාතය අවප්‍රමාණය වීමට පීඩනයක් ඇති කළේය. කෙසේ වෙතත්, පෞද්ගලික සංක්‍රාම ඉහළ යාම, පෙර නොවූ ආකාරයට විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණයක් ලැබීම, වාණිජ ණය ඇතුළත් රජයේ විදේශීය ලැබීම් ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස ගෙවුම් තුලනයේ සමස්ත ශේෂයේ ඇති වූ අතිරික්තය සහ වෙළඳපොළ විශ්වාසනීයත්වය වර්ධනය වීම තුළින් 2006 වසර අග භාගය වන විට ශ්‍රී ලංකා රුපියලේ අනවශ්‍ය අවප්‍රමාණය වීමේ ප්‍රවණතාවය අඩු විය.

### නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතය

2005 වසර තුළ දී අධිප්‍රමාණය වූ නාමික සඵල විනිමය අනුපාතය 2006 වසර තුළ දී එම ප්‍රවණතාවය වෙනස් කරමින් අවප්‍රමාණය වූ අතර මූර්ත සඵල විනිමය අනුපාතය ගිය වසරේ ප්‍රවණතාවයම අනුගමනය කළේය. ප්‍රධාන මුදල්වලට එරෙහිව ශ්‍රී ලංකා රුපියලේ ඉහළ නාමික අවප්‍රමාණය පෙන්නුම් කරමින්, මුදල් වර්ග 5කින් සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය

**5.13 සංඛ්‍යා සටහන** — **විනිමය අනුපාතික වෙනස්වීම්**

| | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම(අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍යය | | | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2004 | 2005 | 2006 | 2004 | 2005 | 2006 | 2005 | 2006 | 2005 | 2006 |
| යුරෝ | 142.32 | 120.96 | 141.58 | 125.79 | 125.10 | 130.63 | 17.66 | -14.56 | 0.55 | -4.24 |
| ඉන්දියානු රුපියල් | 2.40 | 2.27 | 2.44 | 2.23 | 2.28 | 2.30 | 5.67 | -7.19 | -2.22 | -0.86 |
| ජපන් යෙන් | 1.02 | 0.87 | 0.91 | 0.94 | 0.91 | 0.89 | 17.53 | -4.30 | 2.33 | 2.26 |
| බ්‍රිතාන්‍ය පවුම් | 201.37 | 175.94 | 211.29 | 185.35 | 182.87 | 191.53 | 14.45 | -16.73 | 1.35 | -4.52 |
| එක්සත් ජනපද ඩොලර් | 104.60 | 102.12 | 107.71 | 101.19 | 100.50 | 103.96 | 2.43 | -5.19 | 0.69 | -3.33 |
| විශේෂ ගැනුම් හිමිකම් | 161.60 | 145.95 | 162.03 | 149.88 | 148.45 | 153.00 | 10.72 | -9.92 | 0.96 | -2.97 |

| සඵල විනිමය අනුපාත දර්ශක (ආ) | මාසික දර්ශකය | | | වාර්ෂික සාමාන්‍යය | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ලක්ෂ්‍යමය | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2004 දෙසැ. | 2005 දෙසැ. | 2006 දෙසැ. | 2004 | 2005 | 2006 | 2005 | 2006 | 2005 | 2006 |
| නා.ස.වි.අ. (1999-100) | 63.18 | 68.07 | 61.61 | 67.63 | 67.55 | 64.93 | 7.74 | -9.49 | -0.12 | -3.88 |
| මූ.ස.වි.අ. (1999-100) | 94.93 | 107.41 | 112.87 | 93.61 | 101.96 | 108.19 | 13.15 | 5.08 | 8.92 | 6.11 |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම පෙන්නුම් කරයි.


(ආ) නාමික සඵල විනිමය අනුපාතය (නා.ස.වි.අ.) යනු වෙළෙඳ හවුල්කරුවන් සහ තරගකාරී රටවල් 24ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමඟ සිදු කරන වෙළෙඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගින් සෘණ ලකුණින් පෙන්නුම් කරනුයේ අගය අඩුවීම.

**5.10 රූප සටහන** — **විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම්**

**විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම් (2004 - 2006)**
**එ.ජ. ඩොලරයට එරෙහි රුපියලේ අගය**




**සඵල විනිමය අනුපාත දර්ශක**
**මුදල් වර්ග 24 පැස අනුව (1999 = 100)**
**(1999 - 2006)**





අනුපාතය, 2006 වසර තුළ දී අවප්‍රමාණය විය. මේ අතර එක් එක් රටවල විනිමය අනුපාතයේ වෙනස්වීම් වලට අමතරව උද්ධමන අනුපාතයේ වෙනස්වීම් ගලපා සලකා බලනු ලබන මූර්ත සඵල විනිමය අනුපාතය, 2006 වසර තුළ දී අධිප්‍රමාණය වීමෙන් පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාවේ අපනයනවල තරඟකාරිත්වය අඩු වී ඇති බවයි. මෙය වෙළෙඳ හවුල්කාර සහ තරඟකාරී රටවල් සමග සසඳා බලන කල සාපේක්ෂව ඉහළ දේශීය උද්ධමනයේ ප්‍රතිඵලයක් නිසා සිදුවූවකි.

### දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වර්ධනයන්

**2006 වසර තුළ දී ඉහළ ජාත්‍යන්තර වෙළෙඳාම සහ සංක්‍රාම ප්‍රවාහ ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස අන්තර්බැංකු විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය.** ශ්‍රී ලංකා මහ බැංකුව විවිධ ක්‍රියාමාර්ග හඳුන්වාදීම තුළින් විදේශ විනිමය වෙළෙඳපොළ තවදුරටත් පුළුල් කිරීමටත්, වෙළෙඳපොළ ක්‍රියාකාරීන්ට උපදෙස් ලබාදීමටත් දායක විය. වසර තුළ දී විනිමය වෙළෙඳපොළ කටයුතු පුළුල් කිරීම සඳහා දේශීය ගනුදෙනුකාර ආයතනවලට රුපියල් පදනම් කරගෙන හරස් විනිමය විකල්පයන් (Cross Currency Options) ලබාදීමට, ශ්‍රී ලංකා මහ බැංකුව, වාණිජ බැංකුවලට අවසර ලබාදෙන ලදී. ගනුදෙනුකරුවන් විසින් වාණිජ බැංකුවලින් විදේශ විනිමය මිලදී ගැනීමේ සහ වාණිජ බැංකුවලට විදේශ විනිමය විකිණීමේ

**5.11 රූප සටහන** **ත්‍රෛමාසික අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු (2003 - 2006)**




කටයුතුවලින් සැදුම්ලත් ගනුදෙනුකාර වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ද වසර තුළදී වර්ධනයක් පෙන්නුම් කළේය. ගනුදෙනුකාර වෙළෙඳපොළේ හුවමාරු වූ මුළු ගනුදෙනු ප්‍රමාණය, රුපියල පාවීමට හැරීමෙන් පසු වාර්තා වූ ඉහළම අගය වාර්තා කළ අතර, එය 2005 වසරට වඩා සියයට 11 ක වර්ධනයක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත් ගනුදෙනුකාර වෙළෙඳපොළේ ඉදිරි විනිමය ගණුදෙනු සැලකිය යුතු මට්ටමක නොමැති අතර එයින් පෙන්නුම් කරන්නේ විනිමය අනුපාත අවදානම අවම කිරීම සඳහා පවතින උපකරණ භාවිතය පිළිබඳ විශාල වශයෙන් මහජන දැනුවත්භාවය අවශ්‍ය බවයි.

**ඛනිජ තෙල් මිල ඉහළ යාමෙන් ගෙවුම් තුලනයට ඇති බලපෑම අවම කිරීම සහ විනිමය වෙළෙඳපොළේ උච්චාවචනයන් අඩු කිරීම සඳහා, ඛනිජ තෙල් මිල ඉදිරි රැකුම් ගිවිසුම්වලට එළඹීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අවශ්‍ය මූලික පහසුකම් සැලසීමේ ආරම්භක පියවර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබීය.** 2006 වසර තුළ දී ඛනිජ තෙල් මිල වාර්තාගත ලෙස ඉහළ යාම නිසා, ඛනිජ තෙල් ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,070 දක්වා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 415 කින් ඉහළ ගියේය. මේ තුළින්, වෙළෙඳ ශේෂයේ හිඟය ඉහළයාම නිසා වෙළෙඳපොළ තුළ අනවශ්‍ය උච්චාවචනයක් ඇති කළේය. 2006 වසරට පෙර දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉදිරි මිල රැකුම් යාන්ත්‍රණයට ඇතුලත්ව සිටියේ නම්, වෙළෙඳපොළේ ඇති වූ අනවශ්‍ය උච්චාවචනයන් සහ වෙළෙඳ ශේෂයේ හිඟය අඩු කිරීම තුළින් සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට හැකියාව තිබිණි. මෙම හේතුවෙන්, 2007 ආරම්භයේදීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඉදිරි මිල රැකුම් කටයුතු කඩිනමින් සංවිධානය කිරීම සඳහා උනන්දු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කරන ලද අතර, සංස්ථාව මේ වන විටත් මෙම ගිවිසුම් වලට එළඹී ඇත. ඉදිරි මිල රැකුම් උපකරණ හඳුන්වාදීම තුළින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තවදුරටත් වර්ධනය වනු ඇත.

**ශ්‍රී ලංකා මහ බැංකුව සතු නිල වත්කම් ඉහළ නංවා ගැනීම සඳහාත්, විදේශ විනිමය වෙළෙඳපොළේ පැවැති අනවශ්‍ය උච්චාවචනයන් සුමට කිරීම සඳහාත්, ශ්‍රී ලංකා මහ බැංකුව 2006 වසර පුරාම දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතුවලට මැදිහත් විය.** 2006 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව එ.ජ.ඩොලර් දශ ලක්ෂ 791 ක විදේශ විනිමය සැපයීමෙන් සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 307 ක් අවශෝෂණය කිරීමෙන් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත්වීමේ ප්‍රතිඵලයක් ලෙස, 2004 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 515 ක ශුද්ධ සැපයීම් හා සැසඳීමේ දී එය 2006 වසරේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 484 ක අඩු ප්‍රමාණයක් විය. සුනාමි හා සම්බන්ධ විදේශ මුදල් ප්‍රවාහ විශාල වශයෙන් ලැබීම හේතුවෙන් 2005 වසරේදී ශුද්ධ සැපයීම් පහළ මට්ටමක පැවතිණි. විශේෂයෙන් 2006 වසරේ දෙවන හා තුන්වන කාර්තුවල අසාමාන්‍ය ලෙස ඛනිජ තෙල් මිල ඉහළ යාම නිසා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ස්ථාවරව පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ විනිමය සැපයීමට සිදුවිය.